

This is a digital copy of a book that was preserved for generations on library shelves before it was carefully scanned by Google as part of a project to make the world's books discoverable online.

It has survived long enough for the copyright to expire and the book to enter the public domain. A public domain book is one that was never subject to copyright or whose legal copyright term has expired. Whether a book is in the public domain may vary country to country. Public domain books are our gateways to the past, representing a wealth of history, culture and knowledge that's often difficult to discover.

Marks, notations and other marginalia present in the original volume will appear in this file - a reminder of this book's long journey from the publisher to a library and finally to you.

Usage guidelines

Google is proud to partner with libraries to digitize public domain materials and make them widely accessible. Public domain books belong to the public and we are merely their custodians. Nevertheless, this work is expensive, so in order to keep providing this resource, we have taken steps to prevent abuse by commercial parties, including placing technical restrictions on automated querying.

We also ask that you:

+ *Make non-commercial use of the files* We designed Google Book Search for use by individuals, and we request that you use these files for personal, non-commercial purposes.

+ *Refrain from automated querying* Do not send automated queries of any sort to Google's system: If you are conducting research on machine translation, optical character recognition or other areas where access to a large amount of text is helpful, please contact us. We encourage the use of public domain materials for these purposes and may be able to help.

+ *Maintain attribution* The Google "watermark" you see on each file is essential for informing people about this project and helping them find additional materials through Google Book Search. Please do not remove it.

+ *Keep it legal* Whatever your use, remember that you are responsible for ensuring that what you are doing is legal. Do not assume that just because we believe a book is in the public domain for users in the United States, that the work is also in the public domain for users in other countries. Whether a book is still in copyright varies from country to country, and we can't offer guidance on whether any specific use of any specific book is allowed. Please do not assume that a book's appearance in Google Book Search means it can be used in any manner anywhere in the world. Copyright infringement liability can be quite severe.


About Google Book Search

Google's mission is to organize the world's information and to make it universally accessible and useful. Google Book Search helps readers discover the world's books while helping authors and publishers reach new audiences. You can search through the full text of this book on the web at `http://books.google.com/`

Digitized by Google

Ind 2770.5

Harvard College Library



FROM THE BEQUEST OF

HENRY WARE WALES, M.D.

Class of 1838

FOR BOOKS OF INTEREST TO THE SANSKRIT DEPARTMENT

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

ITIHĀSA;

OR

A COLLECTION OF USEFUL INFORMATION CONCERNING THE NATIVES OF CEYLON,

AS RECORDED IN

ANCIENT HISTORIES.

COMPILED BY

WELIGAMA SRI SUMANGALA TERUNNANSE,

PUBLISHED BY

ARNOLD DIAS.

COLOMBO.
1876.

Digitized by Google

E. 4456

In a 2770.5

PAWLING COLLEGE
JUN 13 1893
LIBRARY.

Wales fund.

PRINTED AT THE WESLEYAN MISSION PRESS.

4112
51

Digitized by Google

ඉතිහාසය.

හෙවත්

ලක්දිවිවාසි ජනයා පිළිබඳවූ

පුරාණ කාලයෙහි කථාදිය සඳහා කරුණු අනාගතිකවූ

සඞග්‍රහය.

වැලිගම ශ්‍රී සුමඞ්ගල තෙරුන්නාන්සේ විසින්

සම්පාදනය කරණලදී.

අර්නොල්ඩ් දියස් විසින්

ප්‍රසිද්ධකරණලද්.


1876.

Digitized by Google

කොළඹ, වැස්ලියන් මිෂනාරි උන්නාන්සෙලාගේ
මුද්‍රණාලයෙහි අච්චුගසනලදී.

Digitized by Google

ඉතිහාසයෙහි මූලාරම්භය.



ප්‍රණම්‍යඛිලහුතෙශං ශ්‍රද්ධයා මූකනිදයකං,
ඉතිහාසකථාංශුලක්ෂණාං කරෙම් නිජභාෂයා;
වෙදාණවිපූරණාවව තථා රාමායනාදපි,
මහාවංශාලාඛිකිතාවව සවුඛාත්‍ය ශාස්ත්‍රතා නාම්;
මාවමන්‍යනතු තද්බුධ්වා යදසම්‍යග්විධියතෙ,
ශොධයනතු ක්ෂමාශීලා බුධිමන්තා යථාවිධි;

මෙහි, ඉතිහ පාරම්පර්‍යොපදෙශ ආසෙතාසීන්—යන වාක්‍යයෙහි පරම්පරාවෙන් පැවැත්තාවූ වාක්‍යයතෙම මේ ප්‍රකරණයෙහි පවතියි යන අර්ථයෙහි ඉතිහාසනම්වූයේය.

තාවත්, ධර්‍මාර්ථකාමමොක්ෂාණාමුපදෙශසම්පත්තිනම්,
පූර්ව්වවෘත්තාකථායුක්තමිතිහාසං ප්‍රචක්ෂතෙ;

මෙහි අභිප්‍රාය මෙසේයි, ධර්‍මය-ධනය-කාමතිදෙය ලැබීමය-මොක්ෂය-යන මොවුන්ට ගුරූපදෙශවලින් යුක්තවූ පූර්ව්වකාලයෙහිවූ කථාවෙන් යුක්තවූ ඉතිහාසයකියා-යතුයි. ඉතිහාසොපූරාවෘත්තා පබන්ධොභාරතාදිකොසී—භාරතාදි පූර්ව්වයෙහිවූ කථාප්‍රබන්ධය ඉතිහාසයයිද කියනලදී. මෙසේ ඉතිහාස නම්ලත් මහාභාරත-විෂ්ණුපුරාණාදි පොත්වලින් රැගෙණ පුරාණකාලයෙහිවූ කථාව මේපොතෙහිද දක්වන්නලබනහෙයින් මේද ඉතිහාසනම්විය. මේ කථාවෙන් අභිමතවූ ප්‍රයොජන නම්, ලක්දිවට* විජයරාජකුමාරයාණන් පැමිණෙන කාලයෙහි සිවියෝ යක්ෂයෝ නොවෙත්. යකින්නක් විජයරජු නිසා දරුවන් ලද්දියයි යන්නද ඇදහියයුතු නොවෙයි යනුද බොහෝදෙන සලකන්නාහු නමුත් එකල්හි ලක්දිව විසූ මනුෂ්‍යයෝ කවරහුද යනබවත් දැනගැන්මට හැකිවූ පොතක් සිංහලභාවට නැගී ඇත්තේ නැහැ. ඒ සඳහා මෙහි රාවණකථාව සංක්ෂෙපයෙන් දක්වනුලැබේ. ඒ කථාවෙන් ලක්දිව විජයරජුට පළමුවිසූ මිනිසුන්ගේ පැවැත්ම අවබොධකළහැකිවේ. තවද, මෙරටවාසී බොහෝ දෙනාට නාමය පමණින් අහන්නට ලැබෙණ රාවණ යුඛයද මේ පොතෙන් මදක්

---

* ලංකා-යන ලක්දිව නාමය-ලක-ආසවාදෙ-යන මේ ධාතුහුක්රෙරෙන්-අච්-ප්‍රත්‍යය නැවත ඝඤිලිඞ්භයෙහි-අ-ප්‍රත්‍යය වී සිදුවූ නාම පදයෙකි.

Digitized by Google

දුරට දනහැකිවෙයි. මෙපමණක් නොව විජයරජතුමාගේ පරම්පරාව දඹදිව කවර රජපරම්පරාවෙකින් පැවතෙන එකක්ද යනබව විස්තර වශයෙන් දැනගැනීම මේ රටේ පොත්වලින් නුපුලුවන. එම විජය රජපුරුවන් උපන් දෙශයෙහි, විස්තරකථාව සහිත එහි රජුන්ගේ මුල් පරම්පරාවද මෙසින් දනහැකිවේ. දක්වනලද දෙකාරණය මෙහි අභිමතවූ ප්‍රධාන කරුණුයි. මෙම කථාවගේ ආරම්භයෙහිවූ ප්‍රථමභාගයෙහි මහාවංශයේ සවෙනි පරිච්ඡේදය රැගෙණ අපවිසින් කරණලද සන්නය සහිතව දක්වනුලැබේ. එය පදනම අර්ථවැඩින් වැඩිදෙනෙකුට අභිප්‍රාය නොහැගෙයි යන අදහසින් එහි අභිප්‍රාය දුහුඹුනක ර මේ මූලාරම්භයෙහිද දක්වාලීමට කැමැත්තෙමි.

විජය රජුගේ උත්පත්ති කථාව.

පූර්වකාලයෙහි දඹදිව වඩහජනපදයෙහි වඩහනම් රජෙක්වූයේය. ඒ වඩහ රජතුගේ බිසවිතොමෝ කලිඟු රජතුගේ දුවවිය. ඒ වඩහ රජතෙම ඒ බිසවහට එක් දුවක් ලද්දේය. ඒ රජදුව සිංහරාජයක්හු හා සමග සංවාසයට පැමිණෙන්නියයි නිමිත්තශාස්ත්‍ර දන්නාවූ ශාස්ත්‍රවනතායෝ කිවෝය. ඒ රජදුතොමෝ අතිශයින් රූපශ්‍රියෙන් යුක්තවන්නී බොහෝසෙසින් කාමයෙහි ගිජුවිය. තවද, පියරජුරුවන් විසින් හා මව් බිසව විසින්ද ලජ්ජාවෙන් පිළිකුල්කරණලද්දිවිය. තමා කැමැතිසේ හැසිරීමෙහි සැපකැමැත්තාවූ අප්‍රසිඛවූ ඒ රජදුතොමෝ තනිව නික්ම මගඩ රටට ගැල් ගෙණයන්නාවූ මිනිසුන් හා සමග ගියාය. එසේ යනකල්හි ලාට දෙශයෙහිවූ වනයෙහිදී සිංහයෙක් ගැල්පදිනවුන් ඉදිරියට දිව්යේය. සිංහයා දුටු ගැල්පදින්නෝ අන් දිශාවලට දිව්වෝය. රජදුතොමෝ සිංහයා හා දිශාවට දිවිය. යන්නාවූ සිංහතෙම ඒ රජදුව දුරදීම දැක රැහසිත්ඇත්තේ සමීපයට ගියේය. ඒ රජදුතොමෝ සිංහයා දැක භූ විසින් අසනලද්දාවූ නිමිත්තශාස්ත්‍ර දන්නාවුන්ගේ වචනය සිහිකොට භයනැත්තී සිංහයාගේ අවයවයන් පිරිමැන්දාය. රජදුවගේ සෘජුභාවයෙන් අතිශයින් රැහසිත් ඇත්තාවූ සිංහතෙම භූ පිටනන්වාගෙණ තමාගේ ගල්ගුහාව කරා ගෙණගොස් භූ හා සමග සංවාසයට පැමිණියේය. සිංහයා හා සංවාසයට පැමිණි රජදුතොමෝ සුදුසු කාලයෙහි පුත්‍රයකු හා දුවක්ද යන නිවුන් දරුවන් වැදිය. පුත්‍රයාගේ අත් පා සිංහයාගේ අත් පා හා සමාන බැවින් සිංහබාහුයයි කියාද, දුවට සිංහසීවලියයි කියාද නම්කළාහුය. ඔහොස් අවුරුදු වයසට පැමිණි පුත්‍රතෙම මෑණියනි නුඹ හා පියාද කුමක් හෙතුකොටගෙණ සමානනුවුවාහුදැයි මවගෙන් විචාළේය. රජදුතොමෝ සියදූ තොරතුරු සිංහබාහු කුමාරයාහට කිය. එකල්හි කුමාරතෙම අපි කෙසේමෙතනින් යමුදැයි මවගෙන් ඇසුවේය. තාගේ පියතෙම ගලෙකින් ගුහාව වැසුවේයයි ඈ කිය. එකල්හි කුමාරතෙ

Digitized by Google

ම ගුහාව වසාතුබූ ගල පිටතබාගෙණ ගියේය. එක දවසින්ම ගිය ඇ මාඝීය පණස් යොදුනක් දුරුවූයේය. නැවත සිංහයා ආහාර පිණි ස ගියකල්හි දකුණු පැත්තෙහි මවද වම් පැත්තෙහි නැගනියද තා බාගෙණ කුමාරතෙම ඒ ස්ථානයකෙරෙන් වහා නික්මගියේය. ඉක් බිති ඒ තුන්දෙන කොලඅතු ඇදගෙණ පිවිසර ගමකට ගියාහුය. රජදුවගේ මාමාගේ පුත්‍රයෙක් එකල්හි ජීගම්හි වූයේය. ඒ විඟුරජුගේ සෙනාපතිතෙම පිවිසරගම තැනීම පිණිස ගොස් සිවියේ කම්මාතා විධානකෙරෙමින් සුඛසයක්මුල උන්නේය. සෙනාපතියා විසින් වි චාරණලද්දාවූ ඔහු අපි වනයෙහි වසන්නෝයයි කීවෝය ඒඅසා සෙ නාපතිතෙම ඔවුන්ට වස්ත්‍ර දෙවියේය. ඒ වස්ත්‍රයෝ ඔවුන්ගේ පිණින් මහත්හෝ මාහැඟිවූවාහුය. පත්‍රවල බත් දෙවියේය. ඒ පත්‍රයෝද රන් භාජනයෝවූවාහුය. ඒ කරණකොටගෙණ විසමයට පැමිණි සෙනාපතිතෙම තොපි කවරහුදැයි විචාලේය. රජදුතොමෝ තමා ගේ ජාතිගොත්‍රාදිය කීය. එකල්හි සෙනාපතිතෙම මාමාගේ දූවූ ඒ රජදුව නෙණ වඩනතුවරට ගොස් ඈ හා සමග සංවාසයට පැමිණියේය. සිංහතෙම වහාම ගුහාවකරු ගොස් ඔවුන් තුන්දෙන නොද කා පුත්‍ර ශොකයෙන් මඩනාලද තැනැත්තේ ආහාරපාන නොගත් තේය. සිංහතෙම ඒ දරුවන් ඔසඟුගේ පිවිසර ගමකට ගියේය. සිං හතෙම යම් යම් ගමක්කරු පැමිණේද ඒ ඒ ගම් උපුටයි. පසල්ගම් වාසිහු රජ්ජුරුවන් කරු ගොස් දෙවයන්වහන්ස සිංහයෙක් අපගේ රටට පිඩාකෙරෙයි ඒ පිඩාව වැලැක්වුවමැනවයි දැන්වූවෝය. රජ තොම ඒ අසා සිංහයාගේ පිඩාව වැලැක්විසහැකි පුරුෂයක්හු නො ලැබ සිංහයා අල්වන්නෙක් මෙය ගණිවයි ඇත්කදපිට තබනලද්ද වූ රන් දහසක් නුවර ගමන්කරවූයේය. එකල්හි රටසමර්ථයක්හු නො දැක දෙවෙනි වාරයෙහි රන් දෙදහසක්ද එසේම තුන්වන වර රන් තුන් දහසක්ද පිටත්කරවූයේය. සිංහයා මරණු පිණිස රන් ගැණීම ට කැමතිවූ සිංහබාහු කුමාරයා දෙවාරයෙක්හිම මව වැලැක්වූයේය. තුන්වන වාරයෙහි මවගෙන් නොවිචාරා කුමාරතෙම තමන් පියා මරණු පිණිස රන් ගත්තේය. එකල්හි කුමාරයා රජහට දැන්වූවා හුය. රජතොම ඉදින් තා විසින් සිංහයා මරණලද්දේනම් එකල්හිම තට රජ්‍යය දෙමි කීයේය. සිංහබාහු කුමාරතෙම ඒ ගල්ගුහාව කරු ගොස් පුත්‍ර සෙනහයෙන් එන්නාවූ සිංහයා දුරදීම දැක සිංහයා විදි නු පිණිස රියක් හැරියේය. සිංහයාගේ මෛත්‍රී සිත හෙතුකොටගෙ ණ අපසු හැරුණුවූ රිය කුමාරයාගේ නලළට ලන්ව පාවුල්හි බිම වැවුනේය තුන්වන වර දක්වාම විදිහි එසේම වැවුනාහුය. පසුව සිං හයා කිපුනාවූ සිත් ඇතිවූයේය. එකල්හි විදිනලද රිය සිංහයාගේ ශරීරය විනිවිද නික්මුනේය. එකල්හි කුමාරතෙම බෙල්ලේ ලොම සඟිතාවූ සිංහයාගේ ඉස ගෙණ නුවරට ගියේය. එදින වඩිහ රජුගේ කාලක්‍රියාවෙන් පසු සත්වෙනි දින වූයේය. නැසුනාවූ රජහට පුත්‍රය

Digitized by Google

කු නැති බැවින්ද, මේ සිංහබාහු කුමාරයාගේ ක්‍රියාවට ඇතුවුවු කිසා ද, රජහට මුකුබුරු බව අසාද, කුමාරයාගේ මව ඇඳිනීමද, යන මේ සියල්ල නිසා එක්සිත්වූ සියලු අමාත්‍යයෝ රැස්ව රජවුව මැනවැයි සිංහබාහු කුමාරයාට කීවෝය. කුමාරතෙම රාජ්‍යය ඉවසා ඒ රාජ්‍යය මවගේ සහෝදරියාට දී සිංහසිවලිය ගෙණ උපන් වනයට ගියේය ඒ කු මාරතෙම ඒ වනයෙහි කුවරක් කෙළේය. ඒ කුවර නාමය සිංහපුර නම් විය. වනයෙහි යොදුන් සියයක් නැන්හි ගම් පිහිටුවූයේය. සිංහ බාහු රජතෙම සිංහසිවලිය බිසවකොට ඒ කුවර රාජ්‍යයකරවූයේය. දෙවියොමෝ පුතුන් දෙදෙන දෙදෙනා බැගින් සුදුසු කාලයෙහි සොළොස් වාරයෙක්හි වැදීය. එසින් ප්‍රධාන පුත්‍රයා විජයනම් වූයේය. දෙවෙනි පුත්‍රයා සුමිත්‍රනාම් වූයේය. සියලු පුත්‍රයෝ දෙනිස්දෙනෙක් වූවෝය. රජතෙම සුදුසු කාලයෙහි විජය කුමාරයා යුවරජ තනතු රෙහි පිහිටුවූයේය. විජය කුමාරයා සහිතවූ ඔහුගේ පිරිසද තුසුදුසු පැවතුම් ඇතිවූවාහු රෞදුවූවෝය. කිපුනාවූ මහජනතෙම ඒ කාර ණය රජහට සැලකෙළේය. රජතෙම ඔවුන්ට අහවා මනාකොට පු ත්‍රයාට අවවාදකෙළේය. දෙවෙනිවද ඔවුන්ගේ තුසුදුසු ක්‍රියාවෝ එ සේම වූවෝය. තුන්වන වාරයෙහි වනාහි කිපියාවූ මහජනතෙම තු ඔවහන්සේගේ පුත්‍රයා නැසුවමැනවැයි රජහට කීයේය. ඒ අසා රජ තෙම ඒ විජය කුමාරයා සහිතවූ ඔහුගේ පිරිවර පන්සියයද ඉහ අතී යක් මුඛුවූවන් කරවා නැවෙක්හි නන්වා සමුදුයෙහි ගමන්කරවූයේ ය. ඔහු සියල්ලවුන්ගේ භාග්‍යවන් සහිතවූ කුමාරයන්ද එසේම වෙන් වෙන්ව නැව්වල නන්වා හැරවී. ඔවුන්ගේ කුමාරයෝ නාගදීපයට ගොඩනැගුනෝය. අඹුවෝ මහිඳු දීපයට ගොඩනැගුනෝය. විජය කුමාරයා වනාහි පිරිස් සහිතව සුපාරක පටුන්ගමට ගොඩනැඟී එ හිදී භයට පැමිණ නැවතත් නැවටනැඟී අවුත් බුදුන් පිරිණිවි දින යෙහි ලක්දිවට ගොඩනැගුනේය.

මහාවංශයෙන් ගෙණ මෙහි දක්වනුලබන අනික් කියමන් ගාථා සහිතවූ පදගතාථී සන්න වශයෙන් නොවන බැවින් එය බලන්න වුන්ට තේරුම්ගැන්මෙහි අපහසුවක් නැතැයි සලකා මීට අනතුරුව දෙවන භාගය සඳහා කරුණු දක්වනුලැබේ.

එහි විෂ්ණුහුගේ බලය ප්‍රකාශවන්නේය. එහෙයින් විෂ්ණුහුගේ භවභාවය මේ පොත බලන්නවුන්ට මෙහිදී දක්වාලීම සුදුසුවෙයි. විෂ්ණු-යසු ශිව භකතිකයන්ගේ ඇදහීමට අයිතිවනා ත්‍රිමූර්තියයි කි යනලද මුල්වූ දෙවිවරු තුන්දෙනා අතුරෙන් එකෙනෙකි. මේ විෂ්ණු අරබයා ශෛවයන් විසින් මෙසේ දන්නාලදී.

> වාසුදෙවඃ පරංබ්‍රහම තනමූර්තීනිඃ පුරුෂඃ පරඃ,
> අව්‍යක්තඨා නිගුණඃ ශාන්තඃ පඤ්චවිංශාත්‍යපරෝව්‍යයඃ;

යන මෙයින් විෂ්ණු ප්‍රාණ-ශරීර-සහිතවූ තත්ව විසිපහෙන් තොරබ වද හැඟෙයි.

Digitized by Google

ආත්මජං තෙ වපුරේෂවෙති න පශ්‍යන්ත්‍යාත්මසමභවම්,
යතතු තෙ කෘතතිමං රූපං භදර්‍ශනාති දිවෞ කසඃ;

යන මෙයින් විෂ්ණුහුගේ ආත්මයෙන් උපන්නාවූ ශරීරයක් අහසෙහි නැති බවද හැඟේ.

දෙවෙනීදෘඬිශඛ්‍යානාහෙත තොනානානන්තාදිනිසමෘතාඃ,
එවං හි ශූසෙණා මහාසෙනකාඃ ශූසෙණෙරපි දුරාසදාඃ;

යන මෙයින් විෂ්ණුහුගේ කෙළවර දෙවියන් විසිනුදු දතනොහැකි බවද සියුම් අයවල් විසිනුදු ලන්විය නොහැකි බවද හැඟෙයි.

යං න විදම වයං සරේව පෘච්ඡතෙතාපි පිතාමහං,

යන මෙයින් වාසඃදි ඍෂිවරයන් විසින් බ්‍රහ්මයාගෙන් විචාලෙල් හිද විෂ්ණු සඳහා දැනගන්නට නොහැකිවූ බව හැඟෙයි. විෂ්ණු කරු සියුම් අයටත් ලන්විය නොහැකිනම්, බ්‍රහ්මයාගෙන් ඇසුවන්ටත් දැ නගන්ට නොලැබුනානම්, ඔහුට ප්‍රාණයවත් ශරීරයක්වත් නැත් නම් ඉතින් මෙයින් සැලකියයුතුව පෙණෙන්නේ ඒ විෂ්ණුතෙරෙන් පිහිට ලැබෙයි යන විශ්වාසය සිස්යයි කියයුතු බවයි. එසේවිනමුත් ලක්දිව පවත්නා නාසෂත්‍ර වෛද්‍ය කාව්‍යශාසත්‍රාදි බොහොමයක් ශා සත්‍රපොත් ශිව භතනිකයන් විසින් කරණලද බැවින් ඒ පොත්වලින් ද විෂ්ණුහුගේ බලය ප්‍රකාශවේ. ඒ ආදිය කාරණකොටගෙණ ලක් දිවිවාසි බොහෝජනයා අතුරෙහි විෂ්ණුකෙරෙහි විශ්වාසයෙක් පවතී.

මෙහි දෙවන භාගයෙහිම නොයෙක්තැන්හි ඍෂීන්ගේ නම් දක් නාලැබෙන්, එහෙයින් ඍෂිහු කෙබඳුහුද යනාදීන් ඔවුන්ගේ කථා ප්‍රවෘත්තිය මෙහිදී අඟවාදීම සුදුසුවෙයි, ඒ සඳහා මත්‍සයපුරාණයෙහි ගෙලාකාවලින් ඍෂීන්ගේ තත්වය ප්‍රථමකොට දක්වන්නෙමි.

ඍෂි හිංසාගතොෘ ධාතුර්‍ධෘසතෘතපඃශෘතිඃ, එෂ සනාතිවගයා ය සමාත් බ්‍රාහ්මණශව තතසසඃෂිඃ, විවෘතතාසමකාලංතු බුඛ්‍යා වෘත්තිමෘෂිස්තවයම්, ඍෂතෘති පරමාං යසමාත් පරමර්‍ෂිතතාඃ සමෘතඃ, ගතෘර්‍ථදෘ ෂතොඃතොණිමනිවිෘතතිකාරණම්, යසමාදෙතත් සවයමභූතාසතසමා ච ඍෂිතාමතා, යත්‍රුහෙයින් ඍෂි-යන ධාතුතොමෝ හිංසාවද, ගම නද, ගන මෙහි වන්නිය. ශාසත්‍රයද, සතෘයයද, තාපසද, ඇසීමද, යන මෙතෙම යම් කාරණයෙකින් රුස්වේද ඒ කාරණයෙන් වනාහි බ්‍රා හ්මණතෙම ඍෂිනම් වෙයි. මේ ඍෂිතෙම වනාහි ඉක්මෙන්නාවූ සි යලු කාලය මුලුල්ලෙහි භූවණින් උතුම්වූ ජීවිකාවත් යම් කාරණයෙ කින් පවත්වාද ඒ කාරණයෙන් පරම ඍෂියයි දන්නාලද්දේය. ගම නාජීවූ ඍෂිධාතුහු කෙරෙන් නාමයාගේ උත්පතතියට කාරණනම්, මේ තොම යම් කාරණයෙකින් තමාවූයේද ඒ කාරණයෙන්ද ඍෂි භාවය දන්නාලදී කියා මේ. මිට අනතුරුව ඍෂි කොඹසයෝ දක්ව තුලැබෙත්.

Digitized by Google

සපත්ත බ්‍රහ්මණී දෙවණීමහණීපරමණීයෘ,
කාණ්ඩණීශ්ච ශෘතාණීශ්ච රජණීශ්ච ක්‍රමාවරාෘ;

යනුහෙයින් (භෘගු-මරීචි-අත්‍රි-අඞ්ගිරස්-පුලහ-ක්‍රතු-මනු-දක්ෂ-වසිෂ්ඨ-පුලස්ත්‍ය-යන මේ දශදෙනයයි කියනලද) බ්‍රහ්ම ඍෂිත්වය, (කණ්ව-ඍෂි ආදිකොට ඇති) දෙවඍෂිත්වද, (ව්‍යාස-ආදිකොට ඇති) මහා ඍෂිත්වද, (හෙල-ආදිකොට ඇති) පරම ඍෂිත්වද, (ජෛමිනි ආදිවූ) කාණ්ඩ ඍෂිත්වද, (ශුශෘතාදි) ශෘත ඍෂිත්වද, (ඍතපර්ණ ආදිවූ) රජ ඍෂිත්වද යන මොහු පිළිවෙළින් බාලවූ සප්ත ඍෂිවර්ගීයෝ නම් වෙත්. මෙපමණක් නොව-කාව්‍යස-බෘහස්පත්‍ය-කාශ්‍යපස-ච්‍යවනය-උතථ්‍යස-වාමදෙවස-අගස්ත්‍යස-කෞශිකස-කඳ්දිමස-බාලඛිල්‍යයෝස-විශ්වවස්ත්වය-ශක්තිවසිෂ්ත්වය-යන මොහු තාපසින් ඍෂි භාවයට පැමිණියාහුයයි කියනලදහුයි.

ඔෘචී-ආදිකොට ඇති මහණීත්ව සත්දෙනෙක්ද, කාව්‍යඍෂි ආදිකොට ඇති තවත් ඍෂිත්ව සත්දෙනෙක්ද, වෙදබ්‍රාහ්මණ මුල්කොට ඇති තවත් ඍෂිත්ව සත්දෙනෙක්දැයි අනන්ත ඍෂිත්ව වෙත්. මේ ඍෂිත්ව සියල්ලෝම ප්‍රධාන මනුෂ්‍යයෝ වෙත්. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් ගොත්‍රවල මුල් පියවරුවද රජ්දරුවෝවද සිටියෝය. තවත් කිසි කෙනෙක් ශාස්ත්‍රවනතයෝව සිටියෝය. කිසි කෙනෙක් තපස් ගුණයෙන් අධිකව සිටියෝය. මොවුන් විසින් බොහෝ පොත් කරණලද්දහුය. ඒ පොත්වල ඔවුන්ගේ බල මහිමත්වය නොයෙක්ලෙසින් කියා නිබෙණ බව පෙණේ. ඒවා ඒ ඒ තැන්වල පෙණී නිබෙණ පමණමුත් සියල්ලක්ම එසේමයයි සිතන්නට කාරණ නොලැබෙයි. යම් බලසම්පන්නයකුගේ ඉපදීම ප්‍රකාශකරණකල ඉන් ඉහත හැසිගිය ඍෂිකෙනෙකුගේ බලයෙන් ඔහුගේ ඉපදීම කියා නිබෙණවාය. නුමුත් මේ තැනැත්තාගේ මව්පිය දෙදෙන විද්‍යමානයෝය. මේ ඍෂිවරයන් අතුරෙන් දිව්‍යඥානය ලද්දෝ සිටියෝයයි පේණපමණ මිස ඔවුන්ගේ කිම් අපි දුටු පමණින් සලකනකල දිවඇස් ඇත්තෝයයි කියන්නට නුපුලුවන. දඹදිව ලක්දිව දෙක අතරේ නිබෙණ ලවණ සාගරයෙහි පුදුල සියක් යොදුනෙකැයි වාල්මීක ඍෂින් විසින් ලියනලදී. සියක් යොදුන් ලක්දිවට දඹදිව පටන් සාගරයෙන් මෙතරව එන්න පිණිස කරණලද මාර්ගයෙහි පුදුල මහත් යොදුන් ගණනක් බවද, ඒ වේල්ල තැනීම පිණිස ගෙණඑනලද ගල් යොදුන් දහස් ගණන් මහත්ව තිබුන සැටිද කුමහකණ්ණනම් රක්ෂසයා රු කල දහසක් කිවායයි කියාද මේආදි ඇදගිය නොහැකි නොයෙක් කිම් බලනකල ඒ කළ කතීා ඍෂිවරයෝ දිව්‍යඥානය ලද්දෝයයි කිය නොහේ.

තවද, මේ කාණ්ඩයෙහි රක්ෂසයෝයයි කියා නිබෙණ සැම තැන්වලම වෙදයෙහි විධානවූ පරිද්දෙන් යාගහොමාදිය නොපවත්වන්

Digitized by Google

නාවූ මිනිසුන් සඳහා නියනලදැයි කල්පනාවටගැන්ම සුදුසුයයි අප මතයයි.

හතරවෙනිවූ අවසාන භාගය විෂ්ණුපුරාණයේ හතරවෙනි භාගයෙන් ගෙණ ලියනුලැබේ. නමුදු, විෂ්ණුපුරාණයෙන් ගෙණහැරදක්වනු ලබන්නාවූ බොහොමයක්ම නාමාදීන්ගේ අන්‍යවූ පුරාණාදීන් හා අසමානතාවන් එහිම පහතින් දක්වනුලැබේ. විෂ්ණුපුරාණයෙන් ලියනුලබණ කථාවම හරිවංශයෙහි කියා තිබෙණ පිළිවෙළද බලා දැනගැණීම පිණිස පිළිවෙළින් ඉරෙන් පාත ලියනුලැබේ. මෙසේ මෙහි පුරාණ යන නම් ඇති පොත්වලින් කාන්ඩගෙණ එම භාගයෙහි බොහෝසෙයින් දක්වනුලබණ බැවින් පළමුකොට ඒ පුරාණ පොත් සඳහා කරුණු මදක්දුර මෙහි ප්‍රකාශකිරීම වරිනවාය. ඒ බලා දනයුතු.

සර්ගශ්ච ප්‍රතිසර්ගශ්ච වංශෝ මන්වන්තරාණි ච,
වංශානුචරිතාඝෙඪව පුරාණං පඤ්චලක්ෂණම්;

පුරාණ යනු පරිචෙඡදද, භාගකළාවූ තුඩා පරිචෙඡදද, පරම්පරාද, මන්වන්තර හෙවත් කාලභෙදද, වංශයන්ගේ පවිපාටියද යන මේ ලක්ෂණ පසක්වේ. පුරාණ නම්ලත් පොත්වල ලක්ෂණය යථොක්ත ශ්ලොකයෙන් ප්‍රකාශයි. මේ නාමයෙන් මුල් පොත් දහඅටක් වෙත්, ඒ දහඅවේ නම් අන්‍යතාගීතවූ ශ්ලොකයෝද මෙහි දක්වනුලැබෙත්.

බ්‍රාහ්මං පාද්මං වෛෂ්ණවඤ්ච ශෛවං භාගවතං තථා,
අථාන්‍යන්නාරදීයඤ්ච මාර්කණ්ඩෙයඤ්ච සප්තමම්;
ආග්නෙයමෂ්ටමඝෙඪව භවිෂ්‍යං නවමං තථා,
දශමං බ්‍රහ්මවෛවර්තං ලෛඞ්ගමෙකාදශංස්මෘතම්;
වාරාහං වාදශඝෙඪව සකාන්දඤ්චාත්‍ර ත්‍රයොදශම්,
චතුර්දශං වාමනඤ්ච කෞර්මං පඤ්චදශං ස්මෘතම්;
මාත්‍යඤ්ච ගාරුඩඝෙඪව බ්‍රහ්මාණ්ඩඤ්ච තතඃ පරම්,

(යනුහෙයින් ශ්ලොක දශදහසෙකින් යුත්) බ්‍රහ්මපුරාණය-(ශ්ලොක පස් පණස්දහසෙකින් යුකතවූ) පද්මපුරාණය-(ශ්ලොක තොවිසි දහසෙකින් යුකතවූ) විෂ්ණුපුරාණය-(ශ්ලොක සුවිසි දහසෙකින් යුකතවූ) ශිවපුරාණය-(ශ්ලොක අටලොස් දහසෙකින් යුකතවූ) භාගවත්පුරාණය-(ශ්ලොක පස්විසි දහසෙකින් යුකතවූ) නාරදපුරාණය-(ශ්ලොක නවදහසෙකින් යුකතවූ) මාර්කණ්ඩෙය පුරාණය-(ශ්ලොක සොළොස් දහසෙකින් යුකතවූ) අග්නිපුරාණය-(ශ්ලොක තුදුස්දහස් පන්සියයෙකින් යුකතවූ) භවිෂ්‍යපුරාණය-(ශ්ලොක සොළොස් දහසෙකින් යුකතවූ) බ්‍රහ්මවෛවර්ත පුරාණය-(ශ්ලොක එකොළොස් දහසෙකින් යුකතවූ) ලිඞ්ගපුරාණය- (ශ්ලොක සුවිසිදහසෙකින් යුකතවූ) වරාහපුරාණය-(ශ්ලොක අසූඑක්දහස් එක්සියයෙකින් යුකතවූ) සහ

Digitized by Google

ෂඩ්පුරාණය-(ශ්ලෝක දශ දහසෙකින් යුක්තවූ) වාමන පුරාණය-(ශ්ලෝක සතලොස් දහසෙකින් යුක්තවූ) කූර්මපුරාණය-(ශ්ලෝක විසිදහසෙකින් යුක්තවූ) මත්ස්‍යපුරාණය-(ශ්ලෝක එකුන්විසි දහසෙකින් යුක්තවූ) ගරුඩපුරාණය--(ශ්ලෝක දෙලොස්දහස් එකසියයෙකින් යුක්තවූ) බ්‍රහ්මාණ්ඩපුරාණය-යන මේ පෙන් දසඅට වෙත්.

ව්‍යාස විසින් කියනලද්දාවූ මේ පොත් දහඅට හා සමානවූ වෙන නොයෙක් සෘෂීන් විසින්ද ලියනලද්දාවූ උපපුරාණයනි නම්ලත් තවත් පොත් වෙත්. ඒ පොත්වල නම් මෙසේයි,

ආද්‍යං සනත්කුමාරෙකථිතං නාරසිංහමතඃ පරම්,
තෘතීයං වායවීයඤ්ච කුමාරෙණානුභාෂිතම්;
චතුර්ථං ශිව ධර්මාඛ්‍යං භාෂ්‍යානන්‍යාදිශභාෂිතම්,
දුර්වාසසොක්තමාශ්චර්යඃ නාරදීයමතඃ පරම්;
නන්දිකෙශ්වරයුගමඤ්ච තාලේවොශනසෙරිතම්,
කාපිලං වාරුණං ශාම්බංකාලිකාඛ්‍යමෙව ච;
මාහෙශ්වරං තථා පාදමං දෛවං සවිඛාධකම්,
පරාශරොක්තමපරං මාරීචං භාස්කරාඛ්‍යම්;

තාවද, ශ්ලෝක දශදහසෙකින් යුක්තවූද අටදහසෙකින් යුක්තවූද විෂ්ණුපුරාණ පොත් දක්නාලැබෙත්. එසේද මෙහි අප විසින් භාග යෙකින් පමණක් කරුණු ගෙණහැරදක්වනු ලබන්නාවූ පරාශර ඍෂිවිසින් කියනලද විෂ්ණුපුරාණයෙහි ශ්ලෝක හදුහක් වෙත්. එහි සතර පද ශ්ලෝකානුවූ වාක්‍යයෝද අක්ෂර ප්‍රමාණයෙන් ශ්ලෝකයයි කියනලදහුයි. මේ පුරාණනම් පොත් චතුර්දශ විද්‍යාස්ථානයන් අතුරෙන් එකක්යයි පේණ බැවින් විද්‍යායයිද කියයුතුවෙත්. ඒමෙසේය.

අඞ්ගානි චතුරෙ වෙද මීමාංසා න්‍යායවිස්තරඃ,
පුරාණං ධර්මශාස්ත්‍රඤ්ච විද්‍යාහ්‍යෙතාශ්චතුර්දශ;

යනුහෙයින් (මහාකොට අක්ෂරයන්ගේ නීම උගන්වන්නාවූ ශාස්ත්‍රගනම්වූ ශික්ෂාවය, සාමවෙදඝතයාඝහොමාදි ක්‍රියාවිධායකවූ-ආශ්වලායන-ආපස්තම්බ-කාත්‍යා යනාදීන් විසින් කරණලද සූත්‍රානත්‍ර ගීතවූ ශාස්ත්‍රයයි කියනලද ක්‍රියා කල්පවිකල්පය, මනාවූ පරිද්දෙන් ශබ්දයන්ගේ ඉපදීම අවබොධකරන්නාවූ ව්‍යාකරණ ශාස්ත්‍රය, ඡන්දඃ කත් ආදීන්ගේ ගමන් ස්වරූපාදිය නිශ්චයකරන්නාවූ පඞ්විධවූ ජ්‍යොතිශ්ශාස්ත්‍රය, වර්ණාගම වර්ණවිපර්යයාදීන් කියනලද ප්‍රකෘතිප්‍රත්‍යාදි ශබ්දවයව වෙන්කරන්නාවූ නිරුක්ති ශාස්ත්‍රය, අක්ෂරයන්ගේ නියමයන් කියනලද පිංගලාදීන් විසින් ප්‍රකාශිත ඡන්දශ්ශාස්ත්‍රය යන මේ) වෙදඞ්ගභූතවූ ශාස්ත්‍ර හයද, (දශම්ණ්ඩලයෙහි සූක්තනි එක්දහස් එක්සිය එකානුවක් ඇත්නාවූ ඍග්වෙදය, දෙවෙනිවූ යජුර්වෙදය, තුන්වෙනිවූ සාමවෙදය, සතරවෙනිවූ අථර්වණවෙදය) හි යන මේ

Digitized by Google

ශවද සතරද, පේමිනි විසින් කරණලද කම්මවිභයවූද-බ්‍රහ්මවිභයවූ දැසි දෙයාකාරවූ පරිසාවූ මුල්කොට තාවාවබොධයකරන්නාවූ මීමාංසා ශාස්ත්‍රයද, ද්‍රව්‍යගුණාදි සපත පදාර්ථයන්ගේ අවබොධය පිණිස ශෝතාමාදීන් විසින් කරණලද්දවූ තාර්කිශාස්ත්‍රනාමවූ ත්‍රාණයවිසතරයද, යම්කිසි පුරාණ පොත්හි ප්‍රකාශවූ ශාස්ත්‍රයද, මනු විසින් කරණලද මානව ධර්ම ශාස්ත්‍රයද යන මේ තුදුස චතුර්දශ විද්‍යාස්ථානයෝ වෙත්. කියනලද චතුර්දශවිද්‍යාවන් අෂ්ටාදශ විද්‍යාවන්ට අන්තර්ගතව නිබෙණ ක්‍රමයද මෙසේ දතයුතු.

ආයුර්වේදෝ ධනුර්වේදෝ ගාන්ධර්වශ්චෙව තෝ ත්‍රයඃ,
අර්ථශාස්ත්‍රං චතුර්ථන්තු විද්‍යාදෂ්ටාදශෛව තු;

ධන්වන්තරීන් විසින් කියනලද්දවූ අෂ්ටාඞ්ගයෙකින් යුක්තවූ වෛද්‍යශාස්ත්‍රයයි කියනලද ආයුර්වේදය, භෘගු විසින් කියනලද චතුර්විධවූ ආයුධයන්ගෙන් මිදීම් ආදිය ප්‍රකාශකරන්නාවූ ධනුර්වේදය, භරතමුනි විසින් කියනලද නෘත්ත ගීත ආදිය විභයකොට පවත්නා ගාන්ධර්ව ශාස්ත්‍රය, ගුරු-ශුක්‍ර-කාමන්දක-පඤ්චතන්ත්‍ර-මහාභාරත-ගීතොපදෙශාදියෙහි කියනලද නීතිශාස්ත්‍රය යන මේ සතර මුලනි චතුර්දශ විද්‍යාවන් හා සමග අෂ්ටාදශවිද්‍යාවෝ වෙත්. මෙසේ පුරාණනාම් පොත් චතුර්දශ විද්‍යාස්ථානයන් අතුරෙන් පමණක් නොව අෂ්ටාදශ විද්‍යාස්ථානයන් අතුරෙන්ද නොළෙස්වෙනි විද්‍යාව හෙවත් ශාස්ත්‍රය වන බව අවබොධකටයුතු.

මෙහි මූලාරම්භය මෙතෙකින් සමාප්තකොට ඉක්බිති ප්‍රශංසනීයවූ මහානාම මහතෙරුන්වහන්සේ විසින් රචිත මහාවංශයාගේ සවන භාගය මෙහි ප්‍රථමභාගයකොට යොදා යථොක්ත ක්‍රමයෙන්-වඩිහ සු-යනාදීන් දක්වනලැබේ.

Digitized by Google

Digitized by Google

ඉතිහාසය.

ප්‍රථම භාගය.

වංගෙසු වංගනගරෙ වංගරාජා අහූ පුරෙ,
කාලිංගරණ්ණෙ ධීනාසි මහෙසී තස්ස රාජිනො;

වංගෙසු, වංගනම් රජකුමාරයන්ගේ දෙශයෙහි; වංගනගරෙ, වංගනම් පුර යෙහි; පුරෙ, පුරාණකාලයෙහි; වංගරාජා, වංගනම් රජෙක්; අහූ, වූයේය. 1.

---

1. ලක්දිව රජ පරම්පරාව විජය රජු පටන් පොත්හි දක්නා ලැබේ. මේ විජය රජුගේ පරම්පරාවේ මූල් දෙශය වංග රටයයි මෙහි කියනලද බැවින් මේ වංග රටට දුන් ව්‍යවහාරකරණ්ඩලබණ නාමය කුමක්ද, මේ රට මධ්‍යදෙශයේ කොයි දිශාවෙහි පිහිටි රටක්ද, මෙහි නාමය කෙසේ ව්‍යවහාරවූ එකක්ද, මේ රට කවරතු විසින් කරණලද්දක්ද, මෙහි රජහු කොයි පරම්පරාවකින් පැවත ආ වෝද යනාදි කරුණු විනිශ්චයඉකාට දැනගැන්ම අතිශයින්ම ඕනෑව ඇත. මේ කරුණු යම් යම් තැනක තිබී දැන ගන්ට ලැබුනිනම් ඒක මේ ලංකාවාසින් විසින් සැලකියයුතුවූ ප්‍රයෝජනවත් වැද ගත් කිඹක්යයි කියමු. වංග යන මේ නාමය සංස්කෘත භාෂාවේ නාමයෙකි. සංස්කෘත භාෂාවෙහි නාමයන්ගේ මූලට යෙදී තිබෙණ-ව-යන අක්ෂරය-බ-යන අක්ෂරයට බොහෝසෙයින් පෙරලෙන බව දක්නාලැබේ. එහෙයින් මෙහි අක්ෂර දෙකින් කැමතිවූ අකුරක් එබඳු තැන්වලදී කියන්ට පිළිවන. මේ ක්‍රමයට වංග යන නාමයද, විජණු පුරාණයෙහි-බඞ්ග කියාද, හරි වංශාදි කිසි පොතෙක වඞ්ග කියාද දක්නා ලැබේ. ඒ නාමය දැනට බංගාල-යන නමින් ව්‍යවහාරයි. ඒකම අප රටවාසිහු-බෙංගාල-යයි කියති. බංගාල දෙශයෙහි මෙකල්හි ප්‍රධාන නුවර කලිකතා යන නමින් ප්‍රසිද්ධයි. වංග දෙශය දැනට ව්‍යවහාර නාමයෙන් සැකහැර දැනගැන්ම පිණිස පාණිනි ව්‍යාඛ්‍යාන යෙහි ශ්ලොකයෙක්,

දෙශෙ ශ්‍රීමති වංගනාමනි නගරෙ ශ්‍රීකාලිකතත්තාඛ්‍යෙ
ශ්‍රීමත් තාම්සහෙනඃකාඃකුලබ්‍රුරුක්සාහෙබදතත්තාඹ්‍යා,
ප්‍රාරබ්ධං ධරණීධරෙණ විදුෂා ව්‍යාඛ්‍යානකං පාණිනෙඃ
සූත්‍රාණාං සමන්තුක්‍රමෙණ ච මහාභාෂ්‍යෙණ තට්ටීකයා.

ශ්‍රීමති, ඉස්සරුඇත්තාවූ; වංගනාමනි දෙශෙ, වංගයන නම් ඇති දෙශයෙහි; ශ්‍රී කාලිකතත්තාඛ්‍යෙනගරෙ, ශොභාඇත් නාවූ කාලිකතා යන නම්ඇති නුවරෙහි; ශ්‍රීමත්තාම්සහෙනඃකාඃ කුලබ්‍රුරුක්සාහෙ බදතත්තාඹ්‍යා, ශ්‍රීමත් තෝම්ස් හැන්ඩ්රි කෝල්බ්‍රුක්යන මහත්තා විසින් කරණලද ආඛ්‍යාවෙන්; ධරණීධරෙණවිදුෂා, ධරණී

Digitized by Google

කාලිංගරජ්ජුඤ්ඤ, කලිඟුරජ්ජුගේ; ධීතා, දුවක්; තඤ්ඤරජ්ජෝ, ඒ වංගරජ්ජට; මහෙසිත්තා, බිසවවිය. 2.

ඛර පඬිතයාවිසින්; ප්‍රාරබ්ධං, පටන්ගන් නාලද; පාණිනෙඃ, පාණිනි වාකරණ යාගේ; වාඛ්‍යනකං, අර්ථවාඛ්‍යනය; සූත්‍රාණං, සූත්‍රයන්ගේ; සම්බන්ධමෙණ, පිළිවෙලින්; තථෝකතා, ඒ පාණිනියගේ වීකාවවූ; මහාභාෂ්‍යඤ්ච, මහාභාෂ්‍ය යෙන්ද; ගන්ථ අර්ථයි. වංගදෙශයතුල කලි කතාන්ධවර පිඹිවි බව එම ග්‍රන්ථරදී ලියන ලද යථොක්තා ශ්ලොකයෙන් ප්‍රකාශව තිබෙණනිසා ර්ට සැකකටයුත්තක් නැ හෑ. තවද, මේ කලිකතා යන ග්‍රන්ථර නා මය ලක්දිවිවාසින්ට මෙකල්හි බොහෝ සේ ඇසීමට ලැබේණ එකකි. ලංකාවේ ආන්ඩුව යටතේ තනතුරුවලට පැමිණෙ න කිසිකෙණෙක්ද කලිකතා ග්‍රන්ථරට පෑ මිණ ශාස්ත්‍රඥානාදිය උගත්තෝයසිද අප රට වාසින් විසින් දන්නාලැබෙත්. ඉන් නිසා අනෙක ශාස්ත්‍රාදිය දැනීමෙන් වෘ ක්තාවූ පඬිතයන්ගෙන් මෙකල්හි බබලන කින්දුදෙශයෙහි ප්‍රධාන ග්‍රන්ථරවූ කලිකතා රාජ්ධානීය ලක්දිවිවාසින්ගේ මූල්භූමියක් බව දැනගැන්ම මෙරටවාසින්ට මහත් ප්‍රීතිදුයකවූ කරුණෙකි. වංගජනපදය ම ඛ්‍යදෙශයෙහි සූචීදිඝ රටක්යයි වරහඹිහි ර ආචාරීන්විසින් මෙසේ කියනලදී.

ප්‍රාඛ්‍යනමීදුඪශොණෙඛ්‍ව විඛ්‍යසුඛ්‍යාඃ කලිඛ්‍යබාහලිකාඃ,
ශක්‍යවනමඛ්‍යශබර ප්‍රාඥෙජාතිඤ්ච විනකාමෙබ්‍යාඃ;

මේ වංග නාමයාගේ උත්පත්ති ක්‍රමය | හරී වංශයෙහි මෙසේ කියනලදී.

ඓනාත් තු සුතපා ජඥෙ සුතඃ සුතපසඃ බලිඃ,
ජතෝ මාඳ්‍යාශයොනෞ තු ස රාජ්‍ය කාඛනෙෂුධීඃ;
මහායොගී ස තු බලිඛීභූව නෘපතිඃ පුරා,
සුත්‍රාන්‍යුත්පාදයාමාස පඛවංශකරාන් භුවි:
අඛ්‍යඃ ප්‍රථමතෝ ජඥෙ වඛ්‍යඃ සුඛමසාතෛවව;
තෙෂාං ජනපදාඃ පව අඛ්‍යාඃ වඛ්‍යාඃ සඹුඛමකාඃ,

යන්මේ ශ්ලොකයන්හි, බලි රජ්ජුගේ පුතුන් පස්දෙනා අතුරෙන් දෙවෙනිවූ වඛ්‍ය යන නම්ඇති කුමාරයා සන්තක දෙශය කුමාරයාගේ නාමයෙන් වංගවූ ඥේයයි කියනලදී. මේ ශ්ලොකයෝ ඇ ති පිළිවෙලට අර්ථඝඛ්නව අවසාන භාග යෙහි දක්නාලැබෙත්. මේ රටට වඛ්‍ය නාමය මෙම කුමාරයා නිසා ලද්දේයයිද ඒ දෙශයෙහි රජ පරම්පරාව වඛ්‍ය කුමා රයාගෙන් පැවත ආ බැවින් මෙහි මතු දක්වනුලබණ වසුවංශයෙහි ක්ෂත්‍රියයන් ගේ පරම්පරාවක් බවද දතයුතු. එම පර ම්පරාවද අවසාන භාගයෙහි ක්‍රමයෙන් දක්වන්නමු. එහෙයින් මේ විෂයෙහි ප්‍රථ මකොට රජ්අණ පැවැත්වූ විජයරජ්ජුගේ මූල් පියවරුන්ගේ රජපරම්පරාව එයින් බලා දතයුතු. එකල්හි ඒ පරම්පරාවගේ කිසි ඥානඛ්‍යක් නොපැණේ. අප රටෙ හි පවත්නා මහා වංශාදි පොතවල වංග රජෙක්වූවායයි ලියාතිබෙණ පමණ මිස ඒ වංගරජ දඹදිව කවර රජපරම්පරාවක කෙනෙක්දැයි එකම පොතකවත් කියා නැතිඵක ඒ කථාවට ඥානඛ්‍යක්ව පෙ ණේ. ඒ ඥානඛ්‍ය පිරීම්සඳහා දඹදිව රජ පරම්පරාවන් ලියනලද පුරාණාදි පොත්ව ල ප්‍රකාශික කථාවත් මිට සංග්‍රහකිරීම අවශ්‍යයෙන්ම ඕනෑව පෙණේ.

Digitized by Google

සො රාජා දෙවියා තාසඤ්ඤා එකං අලභි ධීතරං,
පෙම්නානා වාහකරුං තාසඤ්ඤා සංවාසං මිගරාජිනෝ;

සොරාජා, ඒ වංගරජතෙම; තඤ්ඤාදෙවියා, ඒ දෙවියට; එකංධීතරං, එක් දුවක්; අලභි, ලැබුයේය; තඤ්ඤා, ඒ දුවට; මිගරාජිනෝ, සිංහරාජයකුගේ, සංවාසං, සමඟ විසීම: පෙම්නානා, නිමිත්තිගෘහීතයන්නෝ; වාහකරුං, කිහු.

අතීව රූපිනී ආසි අතීව කාමගිද්ධිනී,
දෙවෙනා දෙවියා චාපි උජ්ඣායාසි ජිගුච්ඡිතා;

අතීව, අතිශයින්ම; කාමගිද්ධිනී, කාමයෙහි ඇලෙන්නී; අතිවරූපිනී, අතිශයින් රූඇත්තී, ආසි, විය; දෙවෙනා, පියරජවිසින්ද; දෙවියාවඅපි, සවිඤ්ඤව විසින්ද; උජ්ඣාය, උජ්ඣාවෙන්; ජිගුච්ඡිතාආසි, පිළිකුල්කරණලද්දී විය.

එකාකිනී සා නිහතිමම හෙරිවාරසුඛත්තිනී,
සපෙජෙන සහ අඤ්ඤතා අගා මගධගාමිනා;

හෙරිවාරසුඛත්තිනී, තමාකැමතිසේ හැසිරීමෙහි සැපකැමතිවූ; අඤ්ඤතාසා, අප සිඟවූ ඕතොමෝ; එකාකිනී, තනිව; නිහතිමම, නික්ම; මගධගාමිනා, මගධරටට යන්නාවූ; 3. සපෙජෙනසහ, ගැල්පදින මිනිසකුහා සමඟ; අගා, ගියාය.

---

2. කාලිංගදෙශය මධ්‍යදෙශයෙහි පූර්ව දිග රටෙකැයි, ප්‍රාඛ්‍යමීදඹිශාංශෙ ය නාදින් මේලඟම ඉහතදක්වනලද ශෛලාක්ෂයන් ප්‍රකාශිතයි. මේ පාලිභූරවද බලන්නම් රජතුගේ තුන්වන පුත්‍රවූ කලිඞ්ගකුමාරයා සහනාකව පැවතුනු බැවින් ඒ කුමාරයාගේ නාමයම දෙශයටද ව්‍යවහාරයයි විෂ්ණුපුරාණදියෙහි කියනලදී. මේ කාලිඞ්ගදෙශයෙහි රජපරම්පරාවද වඞ්ග රජපරම්පරාවද යන දෙකම එක පරම්පරාව බව කියහැකි.

3. මේ රට මධ්‍යදෙශයෙහි පූර්වදිග පිහිටි රටෙකි. වෙන-රජුගේපෘථු-සූත-මාගධයයි පුත්‍රයෝ තුන්දෙනෙක් වූවෝය. මෙයින් තුන්වෙනි පුත්‍රවූ මාගධ කුමාරයා මෙහි රජකළ බැවින් මේ රටද මාගධ යයි නම්විය. ඒ මෙසේයි.

අඤ්ඤාපවාහ පෘථිවී සිඛ්‍යනත්‍යනුනානි චිනතයා,
සචිකාමදුහා ගාවඃ පුටකෙ පුටකෙ මධු;
තස්‍ය වෛ ජාතමාත්‍රස්‍ය යශෝ පෙපා මහෙ ශුභෙ,
සූතඃ සූතස්‍යං සඤ්ජනනඃ සෞතහනි මහාතමනඃ;
තඤ්ජෙනව මහායශෝ ජඥෙ ප්‍රාශ්‍රෙඨ මාගධඃ;

මේ මගධරට භූන්ඤන්ගේ කීමේ ප්‍රකාරයට වටඤැනැප්ම 833 ක්‍රයයි කියනලදී. උතුරුදිශාවෙන් ගංගානදියද, බටහිර දෙසින් බරනැසට අයිති රටද, පූර්වදිශින් හිරණ්‍ය පර්වතයද, දකුණු දිගින් සිංහභූමිය හෙවත් හිරණ්‍යඛණ්ඩියද ඉම්ව තිබෙ පාටලිපුත්‍ර රාජගෘහාදි භූවරවල් මේ දෙශය තුල පිහිටාතිබෙණ බවද, මේ රට මැදින් හිරණ්‍යවතී-හෙවත්-ශොණ-යන නම්ඇති නදිය හොස් ගංගානදියට වැටෙනබවද පෙණේ. බුබාගමේ ධර්මය ප්‍රකාශකරණලද මාගධීනාම්ලත් පාලිභාෂාව මෙම දෙශයෙහි ව්‍යවහාරයට නැගි හෙදවිතිබෙන්නාවූ භාෂාවයි.

Digitized by Google

ලාළරඤ්ඤේ අවච්චියා සීහෝ සපඨමභිඛවි,
අඤ්ඤතරා සෙසා ඛාවිංසු සීහාගතදිසනතු සා;

ලාළරඤ්ඤේ, ලාටදෙශයෙහි; අවච්චියා, වනයෙහි; සීහෝ, සිංහයෙක්; සපඨං, හැල් පදිනවුන් කරා; අභිඛවි, දිවිගැස්ස; සෙසා, අනික් ජනයෝ; අඤ්ඤතරා, අන්තැනෙක්හි; ඛාවිංසු, දිවිවාළුය: සාතු, ඒ රාජකුමාරිකාව වනාහි; සීහාගතදිසං, සිංහයා ආ දිසාවට දිවිය.

ගණ්හිත්වා ගොචරං සීහෝ ගච්ඡං දිස්වා තමාරකා,
රතෙත්වා උපාහ ලාළෙනෙත්වා ලංඝුළං පණ්ණකණ්ණකෝ;

ගොචරංගණ්හිත්වා, ආහාරගෙණ; ගච්ඡං, යනහාවූ; සීහෝ, සිංහතෙම; තං, ඒ කුමාරිකාව; ආරකාදිස්වා; දුරදී දැක; රතෙත්වා, ඇළුනාවූ සිත්ඇත්තේ; ලංඝුළං, වාළඛිය; ලාළෙනෙත්වා, ගොලවන්නේ; පණ්ණකණ්ණකෝ, ගෙලනලද කන්ඇත්තේ; උපාහ, සම්පයට ගියේය.

සා තං දිස්වා සරිත්වාන නෙමිත්තාවචනං සුතං
අභිත්වා තස්ස අංගානි රජ්ජනාතී පරාමසි;

සා, ඒ කුමාරිකාතොමෝ; තංදිස්වා, ඒ සිංහයා දැක; සුතං, අසනලද්දුවු; නෙමිත්තවචනං, නිමිතිශාස්ත්‍රදන්නවුන්ගේ වචනය; සරිත්වාන, සිහිකොට; අභිත්වා, භය නැත්තී; රජ්ජනාති, ඇළුම්කරන්නී; තස්සඅංගානි, ඒ සිංහයාගේ ශරීරඅවයවයන්; පරාමසි, පිරිමැන්දය.

තස්සා එසෙසනාතිරතෙත්තා පිසීං ඌරෙපියාසු තං,
සීහෝ සකං ගුහං නෙත්වා තාය සංවාසමාචරි;

තස්සා, ඒ කුමාරිකාවගේ; එසෙසන, සෙවීයෙන්; අතිරතෙත්තා, අතිශයින් ඇලුනාවූ; සීහෝ, සිංහතෙම; තං, ඇ; ආසු, වහා; පිසීංඌරෙපිය, පිටව නන්වාගෙණ; සකංගුහං, තමාගේ ගල්ගුහාවට; නෙත්වා, ගෙණගොස්; තාය, ඇහා සමඟ; සංවාසංආචරි, සංවාසයට පැමිණියේය.

තෙන සංවාසමන්වාය කාලෙන යමකෙ දුවේ,
පුත්තාච ධීතරඤ්ඤි රාජධීතා ජනෙසි සා;

තෙන, ඔහුහා සමඟ; සංවාසමන්වාය, සංවාසයට පැමිණ; කාලෙන, කාලයෙහි; සාරාජධීතා, ඒ රජදුතොමෝ; පුත්තඤ්ච, පුත්‍රයාකුද; ධීතරඤ්ච, දුවක්ද යන; යමකෙ, යුවලවූ; දුවේ, දෙදෙනෙක්; ජනෙසි, එක්වාරයෙහි වැදිය.

පුත්තස්ස හත්ථපාදෙසු සීහාකාරෝ තතෝ අහූ,
නාමෙන සීහබාහූති තං ධීතරං සීහසීවලිං;

පුත්තස්ස, පුත්‍රයාගේ; හත්ථපාදෙසු, අත්පා දෙක්හි; සීහාකාරෝ, සිංහයාගේ සටහන් ඇත්තාහුය: තඤ්ච, ඒ කාරණයෙන්; නාමෙන, නාමයෙන්: තං, ඒ කුමාරයා; සීහබාහූති, සිංහබාහුයයි කියාද; ධීතරං, දුව; සීහසීවලිං, සිංහසීවලියයි කියාද; අහූ, නම්කෙළේය. 4.

---

4. සිංහයා සිව්පාවුන් අතුරෙහි විශ්‍රී වත් එකෙක්. මේ සිව්පාවුන් බොහෝ කොට ඉන්නාවූ අපරදිග රටවල මනුෂ්‍යයෝද මොවුන් මරති. මොවුන්ගේ ඉදිරි

Digitized by Google

පුත්තොතා සොළසවස්සෝ සො මාතාරං පුච්ඡි හංසයං,
තුවං පිතා ව නො අම්ම කාසමා අඝදිසා ඉති;

සොළසවස්සෝ, සොළොස් අවුරුදු වයස්ඇත්තාවූ; සොපුත්තොතා, ඒ පුත්‍රතෙම; අම්ම, මැනියනි; තුවං, ඌබද; නො, අපගේ; පිතාව, පියාද; කාසමා, කවර කාරණයක් හෙතුකොටගෙණ; අඝදිසාඉති, සමානනුවූවාහුද යන; හංසයං, සැකය; මාත රංපුච්ඡි, මව විවාලේය.

ගේ ගාත්‍ර දෙක ඉතා ශක්තිමත්ය. ශබ්දය මෙඝඝර්ජනාවක් මෙන් අතිශයින් භය ජනකය. වල්ගයෙන් ගැසූදමණින් බල සම්පන්න මිනිසකු බිම්හෙළීම මූට පුදුව න. මේ සිව්පාවාගේ උස අඩි හතරක් පහක් පමණද දිග හොනෙක් පමණද ඇත. සිංහයා කිපුතුකල බෙල්ල වටේ තිබෙණ කෙස් පිපෙයි. ඇස් ගිනි සමානය. මේ මෘගයන්ගේ විසම මහ වනතුලවූ ගුහාවලය. මේ සිව්පාවාගේ රූපසම්පන්න රජවරුන්ගේ මුද්‍රාලාංඡනයවද හෙණ කාරණයෙනුත් සිව්පාවුන්ට ශ්‍රේෂ්ඨය යන අර්ථැති මෘගෙන්ද්‍ර නාමයද සිංහයා වම සම්මත බැව්නුත් එපමණක් නොව,

කො විරස්‍ය මනස්විනඃ සුවිශයඃ කො වා විදෙශඃ සුහෘත්,
යං දෙශං ශ්‍රයතෙ භෘශම්ව කුරුතෙ බාහුප්‍රතාපාජිතම්
යද්‍වද්‍ං ෂ්ට්‍රානඛලාංගුලප්‍රහරණඃ සිංහො වනං ගාහතෙ
තස්මිංනෙනව හතවිපත්පුරුඩිරෙඃ තෘප්තාං ජිනතතාකතමනඃ;

මනස්විනඃ, ප්‍රඥාව ධනයකොට ඇති; විරස්‍ය, ශූරයාහට; සුවිශයඃ, තමාගේ රටෙක්නම්; කඃ, කුමක්ද; විදෙශඃවා, අන්‍ය දෙශයෙක්හෝ, කඃසුහෘත්, කුමකැයි දන්නාලදද: යං දෙශම්, යම් රටක්; ශ්‍රයතෙ, ආශ්‍රයකෙරේද; තංඑව, ඒ දෙශයම; බාහුප්‍රතාපාජිතම්, හස්තබලයෙන් අයිතිකිරීම; කුරුතෙ, කෙරේ. දංෂ්ට්‍රා, දත්ද; නඛ, නියද; ලාංගුලප්‍රහරණඃ, වාලඛියද ආයුධකොට ඇති; සිංහඃ, සිංහතෙම; යත්වනම්, යම් වනයක්; ගාහතෙ, අල්ලාද; තස්මිංඑව, ඒ වනයෙහිම; හතවිපෙත්පුරුඩිරෙඃ, නසනලද හස්තින්ගේ ලේවලින්; ආත්මනඃ, තමාගේ; තෘප්තාං, පිපාසය; ජිනතති, සිඳී යි. සිංහයා ඇතුන් මරා ලේ උරා බොණබවක්ද විඥාශම්නම් පඬිතයා විසින් කියනලදහෙයිනුත් වෙනත් කිම් සලකන්නවුන්විසින්ද සිංහයා මහත් බල ඇති මෘගයෙක් බව කියයුතු. තවද, මෙබඳු වල්මෘගයෙක් මඳුඃඛ්‍ය ස්ත්‍රියක් හා ලොකාඛ්‍යාදය කිරීම කරණකොටගෙණ දරුවන් ලැබුනාය යනාදි කථාව එසේ සිඛවූ එකක්මය යනු සිතීම දුෂ්කරයයි කිසි කෙනෙක් අනුමානකෙරෙති. විජයරජුගේ පියා සිංහබාහු යයි යන මේ නාමමාත්‍රයෙන් සිංහබාහු කුමාරතෙම සිංහයකුගේ ශරීරසටහන්හා සමානයයි හෙණ සිංහයකුටම දුව උපන් නේයයි එයින් මැනකාලයෙහි යම්ලෙස කින් යොදුගත්තාහුනම් සිදුනුවූ කිමක් ව්යහැකි. සිංහබාහු යනු සිංහයකුගේ අත් වැනි බලවික්‍රමාඛ්‍යාතවූ අත් ඇත්තෙකැයි කියහැකි. සිංහසමානය යනු ශූරකාව යෙන් සිංහයකුට සමයයි උපචාරාර්ථග්‍රහණයද දක්නාලැබේ. සිංහබාහු යයි කියාද රජදරුවන්ගේ නම් වෙත්. එහෙත් සවහන්විශයෙන් සිංහයකුට සමානය යනාදියක් ඒ සඳහා නොසලකත්. විජයබාහු-ඝජබාහු-ප්‍රාක්‍රමබාහු-යනාදි රජවරුන්ගේ නාම පිළිබඳවූ හසාවාවෘවූ බාහු ශබ්දය නොයෙක් තැන්වල යොදුතිබෙණ අදහසනම් සංග්‍රාමයෙහි ජයග්‍රහණය කරන්නාවූ ශ්‍රෙෂ්ඨවූ අත් ඇත්තෙක යනාදි යයි. ඝජබාහු යනු ඇතෙකුගේ අත සමං

Digitized by Google

සා සඞ්ඝමබ්‍රවී තාසඤ්ච කිනාත්‍රයාමාති ඔබ්‍රවී,
ගුහං ථකෙසි තාතෙත්‍රා තෙ පාසාණෙනාති සා බ්‍රවී;

සා, ඕතෝඛේ; තාසඤ්ච, ඒ පුත්‍රයාට, සඞ්ඝඤ්ච, සියල්ල කියා; සෝ, ඒ පුත්‍රතෙම; කිනාත්‍රයාමඉති, කෙසේ ගමුදැයි; අබ්‍රවී, කීවේය. සා, මච්ඡොඛේ; තෙ, තාදෙශ්; තාතෝ, පියතෙම; පාසාණෙන, ගලෙකින්; ගුහංථකෙසි ඉති, ගුහාව වැසුවේයැයි; අබ්‍රවී, කීය.

මහාගුහාය ථකනතකං ඛතෙඩිනාදාය සෝ අගා,
එකාහෙනෙව පඤ්ඤාසයොජනානි ගතාගතං;

මහාගුහාය, මහත් ගුහාව; ථකනතකං, වසන්නාවූ ගල; ඛතෙඩිනඅදාය, පිරීන් ගෙණ; සෝ, ඒ කුමාරතෙම; අගා, ගියේය. එකාහෙනඑව, එක් දවසින්ම; ගතාගතං, ගියද මාගියය; පඤ්ඤාසයොජනානි, පනස්යොදුනෙක් දුර වෙත්. 5.

ගොචරාය ගතෝ සීහෙ දඤ්ඡිණාසමිං ගි මාතරං,
වාමෙ කණිඨිං කත්වාන තාතෝ සීඝං අපක්කමි;

සීහෙ, සිංහයා; ගොචරායගතෙ, ආහාරපිණිස ගියකල්හි; මාතරංහි, මව වනා හි; දඤ්ඡිණාසමිං, දකුණු පැත්තෙහිද; කණිඨිං, නැඟනිය; වාමෙකත්වාන, වම්පැත් තෙහිකොට; තාතෝ, ඒසිංහයා කෙරෙන්; සීඝං, වහා; අපක්කමි, පහවගියේය.

නිවාසෙත්වාන සාඛං තෙ පඩ්ඩතාගාමමාගමුං,
තත්ථාසි රාජධිතාය මාතුලාසස්ස සුතෝ තදා;

තෙ, ඔහු; සාඛං, පත්‍ර; නිවාසෙත්වාන, හැඳ; පඩ්ඩතාගාමං, පිටිසර ගමකට; ආග මුං, ආවාහුය. තත්ථ, ඒ ගමහි; රාජධිතාය, රජදුවණේ; මාතුලාසස්ස, මාමාගේ; සුතෝ, පුත්‍රතෙම; තදා, ඒ කාලයෙහි; ආසි, වූයේය.

සෙනාපති වංගරඤ්ඤෝ ජිතෝ පඩ්ඩතාසාධනෝ,
නිසිනෝනා වටම්බුලෙ සෝ කම්මනතං සංවිධාපයං;

වංගරඤ්ඤෝ, වංගරජහුගේ; සෙනාපති, සේනාපති තෙම; පඩ්ඩතාසාධනෝ, පිටිසරගම සැදීමෙහි; ජිතෝ, සිටියේ; කම්මනතංසංවිධාපයං, කම්මානතවිධානකර ණුගේ; සෝ, හෙතෙම; වටම්බුලෙ, තුගහසක් සම්පයෙහි; නිසිනෝනා, හුන්නේවේ.

නවූ සවහන් ඇති අත්භැක්තෙකැයි කි සා ශබ්දවාත්‍රුයෙහි අතීත නොව බලයෙන් ඇයතු සමාන අණ ඇත්තෙකැයි කියා නොහොත් සවන්කිරීමෙහි අතේ බලය ඇතතුගේ අතක් සමානයයි කියා හෝ ශබ්දයට ප්‍රතිපක්ෂව අතීය සැලකිය හුතු. මේ කුමයට බලනකල සිංහබාහු යන නා මයකම් සිංහයතුගේ පුත්‍රයෙක් නුවූවත් සිසසැකි එකකි. මෙබඳුවූ කිම් ඉතිහාස කථාදි සුරුණ පොත්වල ලියා තිබෙණ බ ව පමණක්ම සාක්ෂිකොට ගෙණ ඒ කිම් ඒකාන්තයෙන් සත්‍යමයයි නුවුවැකි ලොකයා නොඅදහත්.

5. පොදුනෙක් යම් මධ්‍යදෙශයෙහි ව්‍යවහාර කුමයට ඔඹ අවදහයෙකි. සිංහ බාහු කුමාරයා එහි කියනලද පමණ දුර ගමන්කරන්ට ඇතැයි සිතීම හා සමානම වනයෙහි මේ ගණන ගත්තේ කෙසේදැයි සිතීමත් නුසුදුසුකි. යොදුන් පනසට ඔඹ කාරලක්ෂයෙකි.

Digitized by Google

දිස්වා තෙ පුච්ඡිතා ඉවාචුං අටවිවාසිනො මයං,
ඉති සො දූපයී තෙසං වත්ථානි ඛජ්ජී පති;

තෙ දිස්වා, ඔවුන් දැක ; පුච්ඡිතා, විචාරණලද්දහු; මයං, අපි; අටවිවාසිනොඉති, වනයෙහි වසන්නෝයයි , අවොචුං, කීවාහුය. සොඛජ්ජීනිපති, ඒ සෙනාපතිතෙම; තෙසං, ඔවුන්ට; වත්ථානිදූපයි, වස්ත්‍රදෙවිඒය.

තානාහෙසුං උළාරානී භතානං පණ්ණාසු දූපයී,
සොවණ්ණභාජනානාසුං තෙසං පුඤ්ඤෙන තානි ච;

තානි, ඒ වස්ත්‍රයෝ , උළාරානිඅහෙසුං, මහත්වූවාහුය. පණ්ණාසු, පත්‍රයන්හි; භතානංදූපයි, බත්දෙවුඒය. තානිච, ඒ පත්‍රයෝද; තෙසංපුඤ්ඤෙන, ඔවුන්ගේ පුණ්‍යප්‍රභාවයෙන් ; සොවණ්ණභාජනානිඅසුං, රන්භාජනයෝ වූවාහුය. 6.

තෙන ඉමෙ විම්භිතා පුච්ඡි කොසු තුමොහ චම්පති,
තස්ස සා ජානිගොතානි රාජධීතා නිවෙදයි;

තෙන, ඒ කාරණයෙන්; විම්භිතා, විස්මයපැමිණියාවු; සොචම්පති, ඒ ශ්‍රුවරජතෙම ; කොසුතුම්හෙ, තොපි කවරහුදැයි ; පුච්ඡි, විවාලේය. සාරාජධීතා, ඒ රජදූ දොවෝ ; තස්ස, ඒ ශ්‍රුවරජහට ; ජානිගොතානි, ජාතිගොත්‍රයන් ; නිවෙදයි, දන්වී.

පිතුච්ඡා ධීතරං තං සො ආදාය ඛජ්ජනීපති,
ගනත්වාන වංගනගරං සංවාසං තාය කපයි;

ඉඛජ්ජනිපති, ඒ ශ්‍රුවරජතෙම ; පිතුච්ඡාධීතරං, පියාහන් සහොදරියගේ දූවූ ; තං, ඒ රජදූව; ආදාය, ගෙණ ; වංගනගරංගනත්වාන, වංගනුවරට ගොස් ; තාය, ඇහා , සංවාසංකපයි, සංවාසයකෙළේය.

සීහො සිඤං ගුහං ගනත්වා තෙ අදිස්වා තයො ජනෙ,
අට්ඨිතො පුත්තසොකෙන න ච බාදි න චාපිවි ;

සීහො, සිංහයෙම; සිඤං, වහා; ගුහංගනත්වා, ගුහාවට ගොස්; තෙතයොජනෙ, ඔවුන් තුන්දෙනා ; අදිස්වා, නොදැක; පුත්තසොකෙන අට්ඨිතො, පුත්‍රශොකයෙන් පීඩිතවූයේ ; නබාදි, නොමකෑයේය ; නවඅපිවි, නොමබීයේය.

දූරතෙ තෙ ගවෙසනෙත්වා අගා පඛනාගාමකං,
උඛාපියති සො සොව යං යං ගාමමුපෙති සො;

නෙදූරතෙ, ඒ දරුවන් ; ගවෙසනෙත්වා, සොයන්නේ; පඛනාගාමකං, පිවිසර ගවට; අගා, ගියේය. සො, හෙතෙම ; යංයංගාමං උපෙති, යම් යම් ගමකට පැමිණෙන්ද ; සො සො එව, ඒ ඒ ගමම; උඛාපියති, උපුවන්නුලෑඛේ.

පඛනාවාසිනො ගනත්වා රඤ්ඤෙ තං පටිවෙදයුං,
සීහො පිළෙති තං රඨං තං දෙව පටිසෙධය;

පඛනාවාසිනො, පිවිසරගම්වාසිහු; ගනත්වා, ගොස් ; දෙව, දෙවඟන්වහන්ස; සීහො, සිංහයෙක්; තංරඨං, ඒ රට ; පිළෙති, පීඩාකෙරේ. තං, ඒ පීඩාව ; පටිසෙධය, වැලැක්වුවමැනවැයි ; රඤ්ඤෙ, රජහට ; තං, ඒ කාරණය; පටිවෙදයුං, දන්වූවාහුය.

---

6. වස්ත්‍ර මහත්වූවෝය යන්න හා පත්‍රයෝ රන්භාජනවූවෝය යන්නද මේ කථාවට ප්‍රයෝජනයක් නොපෑහේ.

Digitized by Google

අලභං නිසෙධකං තස්ස හත්ථිකඛණ්ඩහතං පුරෙ,
ආදෙතු සිහාදුඝීති සහස්සං සෝ පවාරයි;

තස්ස, ඒ පිඛාව; නිසෙධකං, වලක්වන්නකු; අලභං, නොලබන්නාවූ; සෝ, ඒ රජතෙම; හත්ථිකඛණ්ඩහතං, ඇත්කඳපිට තබාගැලද්දුවූ; සහස්සං, දහසක් කහවනු; සිහාදුඝී, සිංහයාගන්නෙක්; ආදෙතු ඉති, ගණිවසි; පුරෙ, නුවරවිසියෙහි; පවාරෙසි, ඝොෂණාකරවූසේය.

තථෙව වෙ සහස්සානි තීණිචාපි නරිස්සරෙ,
විසු වාරෙසු වාරෙසි මාතා සිහබහූපං හි තං;

තථාඑව, එසේම; නරිස්සරෙ, රජතෙම; වෙසඟහාණි, දෙදහසක්ද; තීණිඑාපි, තුන්දහසක්ද නුවරගන්නාකරවූසේය. මාතා, මව්තොමෝ; තංසිහබහූපංහි, ඒ සිංහබාහුකුමාරයා වනාහි; විසුවාරෙසු, දෙවාරයෙක්හී; වාරෙසි, වැලැක්වූසේය.

අඝාහි තතියෙ වාරෙ සිහබාහු අපුච්ඡිය,
මාතරං නිසහස්සං තං ඝාතෙතුං පිතරං සකං;

තතියෙවාරෙ, තුන්වෙනි වාරයෙහි; සිහබාහු, සිංහබාහු කුමාරතෙම; මාතරං අපුච්ඡිය, මව විචාරා; සකංපිතරංඝාතෙතුං, තමාගේ පියා ඝාතනපිණිස; තංනිසහස්සං, ඒකඝවනු තුන්දහස; අඝාහි, ඝත්තේය.

රඤ්ඤො කුමාරං දසෙසසුං තං රාජා ඉදමබ්‍රවි,
ගහිතො යදි සිහො තෙ දම්මි රජ්ජං තදෙව තෙ;

රඤ්ඤො, රජතව; කුමාරං, කුමාරයා; දසෙසසුං, දැක්වූවාහුය. රාජා, රජතෙම; සිහො, සිංහතෙම; තෙ, තාවිසින්; යදිගහිතො, ඉදින් ගන්නාලද්දේද; තදඑව, එකල්හිම; තෙ, තව; රජ්ජංදම්මි; රාජ්‍යය දෙමිකියා; තං, ඔහුට; ඉදං, මේ වචනය; අබ්‍රවි, කීසේය.

සෝ තං ගනත්වා ගුහාවාරං සීහං දිස්වාව ආරකා,
එනතං පුත්තාසිනෙහෙන විජ්ඣිතුං තං සරං ඛිපි;

සෝ, ඒසිංහබාහුකුමාරතෙම; තංගුහාවාරංගනත්වා, ඒගුහාවගේ දොරකඩවගොස්; පුත්තසිනෙහෙන, පුත්‍රස්නේහයෙන්; ආරකා, දුරින්; එනතංසිහං, එන්නාවූ සිංහයා; දිස්වාඑව, දැකම; තං විජ්ඣිතුං, ඒ සිංහයා විදිනුපිණිස; සරං, ඊයක්; ඛිපි, හැරියේය.

සරෝ නාලාටමාහඩ මෙත්තාචිත්තෙතන තස්ස තු,
කුමාරපාදමූලෙව නිච්චෙතා පති භූමියං;

තස්සතු, ඒ සිංහයාගේ වනාහි; මෙත්තාචිත්තෙතන, මෛත්‍රීස්නේහ කරණකොටගෙණ; සලාටංආහඩ, නළලනිසා; නිච්චෙතාඅරෙ, නැවතුනාවූ භීයතෙම; කුමාරපාදමූලෙඑව, කුමාරයාගේ පාමුල්හිම; භූමියංපති, භූමියෙහි වැටුනේය.

තථාසි යාවතතියං තතො කුජ්ඣි මිගාධිපො,
තතො ඛිත්තා සරෝ තස්ස කායං නිබ්භිජ්ඣ නිකඛමි;

යාවතතියං, තුන්වර දක්වා; තථාඅසි, එසේම වූසේය. තතො, ඉන්පසු; මිගාධිපො, සිංහතෙම; කුජ්ඣි, කිපියේය. තතො, ඉන්පසු; ඛිත්තාඅරෝ, විදිනලද්දුවූ භීයතෙම; තස්සකායං, සිංහයාගේ ශරීරය; නිබ්භිජ්ඣ, විනිවිද, නිකඛම්, නික්මුනේය.

Digitized by Google

සකෙනචරං සිහසීසමාදුය ච පුරං අගා,
මතාසෙ වංගරාජස්ස යතතාහානි තාදු අහු;

සෝ, ඒ කුමාරතෙම; සකසරං, බෙල්ලේ ලොම්සකිතවූ; සිහසීසංආදුය, සිංහයා ගේ ඉපදගණ; පුරංඅගා, නුවරට ගියේය. මතසෙ, කාලක්‍රියාකළාවූ; වංගරාජස්ස, වංග රජහට; තදු, එකල්හි; සත්තාහානි. සත්දනක්; අහු, වූවාහුය.

රඤ්ඤෙ අපුත්තකතතා ච පතීතා ච සසනාවුතා,
සුත්වා ච රඤ්ඤෙ නාතතුතතං සඤ්ඤානිත්වා ච මාතරං;

රඤ්ඤෙ, රජහට; අපුත්තකතතාව, පුත්‍රයකු නැතිබැවින්ද; රඤ්ඤනතතුතතං, රජහට බුත්‍රබුරුබව; සුත්වාව, අසාද; මාතරං, මව; සඤ්ඤානිත්වාව, හැඳිනද; අසස කම්වූනාව, මේ කුමාරයාගේ ක්‍රියාව කරණකොටගෙණද; පතීතා, සතුටුවූ.

අමඛා සනානිපතිතා අධිලා එකමානසා,
සිහබාහු කුමාරං තං රජා හොතීති අබ්‍රුවුං;

එකමානසා, එක්සිත්වූ; සනානිපතිතා, රැස්වූ; අධිලාඅමඛා. සියලු අමාත්‍යයෝ; රජාහොතීති, රජවවයි; තංසිහබාහුකුමාරං, ඒ සිංහබාහුකුමාරයාට; අබ්‍රුවුං, කීහ.

සෝ රජ්ජං සමපටිවිජිත්වා දත්වා මාතුපතිස්ස තං,
සිහසීවලිමාදුය ජාතභූමිං ගතො සයං;

සෝ, ඒ කුමාරතෙම; රජ්ජංසමපටිවිජිත්වා, රාජ්‍යය පිළිගෙණ; තං, එය; මාතුපති ස්ස, මවගේ සවාමියාට; දත්වා, දී; සයං, තමා; සිහසීවලිං ආදුය, සිංහසීවලිය ගෙණ; ජාතභූමිං, උපන් වනයට; ගතො, ගියේය.

නගරං තත්ථ මාපෙසි අහු සිහපුරනති තං,
අරඤ්ඤෙ යොජනසතෙ ගාමෙ වාපි නිවෙසයි;

තත්ථ, ඒ උපන්වනයෙහි; නගරංමාපෙසි, නුවරක් කෙළේය; තං, ඒ නුවර; සිහ පුරංඉති, සිංහපුරයයි; අහු, නම්වූයේය. අරඤ්ඤෙ, වනයෙහි; යොජනසතෙ, යොදුන් සියගණක්තැන්හි; ගාමෙවාපි, ගම්ද, නිවෙසයි, පිහිටුවූයේය.

ලාළරඨෙ පුරෙ තසමිං සිහබාහුනරාධිපො,
රජ්ජං කාරෙසි කත්වාන මහෙසිං සිහසීවලිං;

සිහබාහුනරාධිපො, සිංහබාහු රජතෙම; ලාළරඨෙ, ලාටදෙශයෙහිවූ; තසමිංනග රෙ, ඒ නුවරෙහි; සිහසීවලිං මහෙසිංකත්වාන, සිංහසීවලිය දෙවියකොට; රජ්ජංකා රෙසි, රාජ්‍යයකරවී. 7.

---

7. සිංහබාහු කුමාරයා විසින් කරණලද නුවර සඟිතවූ මේ ලාටනම් දෙශයද ලක්දිවිවාසීන්ගේ සහ මෙහි පුරුණරජුන් ගේත් මූල්වූ භූමියක්බැවින් මේ දෙශයෙහි කරුණුපිළිබඳවූ කථාව පුලුවන්පමණ දුර පැහැදිලි වශයෙන් දැනගතහැතුවේ. මේ ලාටදෙශයට කිරණසඟණි කියාද සිං හ භූමි කියාද නම් වෙත්. තාම්‍රලිප්ති රාජ්‍යයට වයඹදෙසින් හැතැප්ම 117 ක් ගියතැනද, ඔඩ්‍රා දෙවත් ඔරිසා යන නම් ඇති රටවලට ඉසාන දිගින් එපමණ දුර ගියතැනද–සිංහභූමිය සහ කරණභූමිය ඒක

Digitized by Google

ල සඬණ්ඩෑයි ගංගාවට තුදුරුවී කිරණ සඬණ්ඩෙයි ප්‍රධාන තුවර තිබෙණ බව පෙනේ.

සිංහගුම්බ යන නාමය මේ රටට සැබෑ ඇත්තේ සිංහබාහු කුමාරයාගේ රට නම සිනැයි හැඟේ. මෙහි වට ප්‍රමාණය සැතැප්ම 133 පමණ 150 දක්වියැය.

යොදුන් සියයක් තැන තම්පිබිදිවූයේ යයි ඉහළ ශ්ලෝකයෙහි කියනලද ප්‍රමාණය කලින්කල රටවල් මේ නොයෙක් පරිද්දෙන් වෙනස්වීම කරණකොටගෙන සම නොවනවාද නොහොත් මේ කියමන්ව ල වෙන යම් විරුඛයෙක්ද ඇතැ හොඳ. සිංහ භූමියෙහි ප්‍රඛ්‍යාත මිනිසුන්ගේ නම-සෝ-කියාදෙන්නේ කියාද වේ. එහි අර්ථය මනුෂ්‍යයා කියයි. ඔවුන්ගේ විසිම සිංහ භූමියෙහිය. යුඛකාරයෝ ය යන අර්ථ ඇති-ලාරජා-යන නමක්ද ඔවුන්ට අයිතිය. මේ ජාතිය ඒ රාජ්‍ය වාසින් ඉතුරෙක් ඝේරවු ශුබ්ලි ඉතා බෑදෙන්නට කොටසෙකි. මේ දෙශයෙහි ඇතැ සෙක් පලාත්වල කුවාර්-කොරේවා-ඛෙරියා-භූම්ප්-සාන්තල්-සුවන්ගා-හෙවත් පැවුන් යන නම් ඇති සම්මිශ්‍රණ වෙ

ශයන්. මේ සියලුදෙනාටම-ඔන්ඩා-යන නාමයයි, හෝර් කියන මනුෂ්‍ය වර්ගය දැකිමට ප්‍රියවූ ඝණිත ඇත්තෝ වෙති. ඔ ඔවුන්ගේ අඟුළුවට ඝෙඩේ තැනි දුසි ස්වභාවයක් තපෙණෙන්ට තිබෙණවා. ඔවුන්ගේ රූප ලක්ෂණය ආයිවරුන්ට සමානය. උස්වූ නාසා ඇත්තෝය. මනාවූ මහත් ඔඹ ඇත්තෝය. ප්‍රියවූ දත් ඇත්තෝය. ලුස් ඕවි ප්‍රඛ්‍යාණයෙන් ඔබානෙන්ය. ගම්භීර ඛිණිය එළඳුණ, ඝනකාවිය. කිරණ තෙත් තෙනකි අර්ථය තම් කියවූ සඬ්ඛ්‍යායෙහි කියයි. සඬණ්-යනනාමය-සවරා-හෙවත්-සුවාර් යන මනුෂ්‍යවර්ගය සඳහායයි කියනලදි. දක්ඛතාලද කාරුණු ඇම්ප්ති ජනරල් ක නිබ්ඛැම් උත්තෙන්ගේ කියා තිබේ. සිංහ භූමියෙහි කියන රට ලාඩ දෙශය ඔවුන් එහි වතීමාන කාලයේ වසන මිනිසුන්ගේ සභාවී හා නාමාදියත් මෙසේ දතයුතු.

මේ-ලාට-යන නාමය අප රටවාසීහු ලාබයෙහි දනිත්. ඔබදෙනවාසීහු ලාබයෙහි කියති.

කඛඩ, සිංහල දෙශයෙහි ලිඛනලද නඤතු ප්‍රකරණවල,

දුගණදිනවාරපතිදීගණෙපි හි දෙශකාලසබ්බඩ,
ලාබිඋවාසෙසිඛොකාඛාං ඝවඤපුරෙඛිසඤඤගූඛෙසිඃ

දිනගන්ගේ ගණන නොතැකොවිගෙණ දින පවුහයාගේ පැමිණීම නිස්චීය. දින ගන්ගේ ගණනද දෙශ කාල දෙක පිළිබ දගයි ලාව ආවාසීයා විසින් කියනලද හයි උකත බැවින්-ලාට-දෙශයෙහි නඤ තුත දුනීමෙන්ද ව්‍යකතවූ ගුරුවිරයන් සු

ඝොරසෙනි හි ගොඩි ව ලාටි ච්චානඤ ච තාදිසි,
යාති ප්‍රාකෘතභිඤ්ඤෙවං ව්‍යවහාරෙඤ්ඤ සඤඤිධිම්;

වඩුරා නම් රට හා එකාබඛවූ ශූරසෙන රටවද්, වඤ-ඝඤා-රට දෙක ඉතර පිළිවි ගොඩ දෙශයද, දඤඤිදිඝ පිහිටි ලාට දෙශයද, යන මේ රටවල් කෘතාද අනිකුදු එබඳු ආවනති-බාඝඩි-දෙමළ-ව්‍යාකරණික-ඝණාදි භාෂාද ව්‍යවහාරරූඪි ඇතිදී ප්‍රාකෘ

ත බසිට පැමිණෙන්යයි කියනලද බැවින් ලාට දෙශවාසීන්ගේ භාෂාව එක්තරා ප්‍රාකෘත භාෂාවක් බව දනිවූ. මෙව භාෂාව පුරාණ සිංහල භාෂාවේ බොහෝ ශබ්ද හා සමානාද ව්‍යකෘතයි. විජය රාජකුමාරයා ලක්දිවට පැමිණෙන කාලයව වත්තෙන්

Digitized by Google

ලක්ඛිව මිසුමින් විසින් වෘවහාරකරණලද ශබ්දහා අර්ථයෙන් පැහැණියන් විසින් විවහාරකලාවූ ශබ්දන් සහ දෙකොටසම සිංහල්ලොකයි හා මිශ්‍රය යන කල්හි නාව වෘරදියහි කියලොකේ.

සහිද, ප්‍රාකෘත භාෂාව අනික් භාෂාවලට වඩා මිනා මුල් භාෂාවක්යයි කියා කියි කොලොක්ද, සෑ මාගධී මූලභාෂා, යනු කියලද බොව්න් පාලි භාෂාව මූලභාෂා වියයි කියාද අප රටිවාසින්ගේ මත කිපයෙකි. සංස්කෘත-පාලි-සිංහල-යන ප්‍රාකෘතයට අයිතිවියහ භාෂාද උක්දිම් වත්ත නා බැවින් මේ භාෂාවන්ගේ මූලභාවය අරබයා පවිත්‍රහා මෙම විරුඩ මතය සි ලක්ඛනු සිහිය මෙහි කරුණු දක්වීම් යුතුවෙයි.

සංසකෘතං නාම දේවවි විභාවෝසභාහා මහර්ෂිභිඃ,
සදහවිසාහාසභෝ දෙශිභාහානොභා ප්‍රාකෘතොසුබවඃ;

පාණිනි ආදි සෘෂීන් විසින් පසුව වහවී හාරකරණලද්දවූ දෙවියන් විසින් කියන ලද්දවූ වාක්‍යයනොමෝ සංසකෘතයි. සංසකෘතයට සමානවූද සංසකෘතයෙන් උපන්නාවූද ඒ ඒ දෙශවල හවිගත්තාවූ දැසි ප්‍රාකෘත භාෂාවන්ගේ ක්‍රම නොයෙක් පරිදි ඇත්තේය යනු ශෙලාකයෙහි අදී යයි. මෙසේ ප්‍රාකෘතයෙහි ඇතම් ක්‍රම සංසකෘතයෙන් උපන් බවාදිය දක්වන්නාවූ දැයි ආචාර්‍යතෙමේ සංසකෘතයෙන් ප්‍රාකෘත භාෂාවන්ගේ උපතතිය කියා, මූලභාෂාව එකක්මවූත් කිපයක් නියනොවේ. ප්‍රාකෘත බොහෝයයි කියන්නාවූ ආචාර්‍යයාද ප්‍රාකෘතයෙහි මූලවියක් නොකියා. මෙහි ඉහත, ශෞරසෙනි ව ඉගැබ් ව, යනාදි ශෙලාකයෙහි, ශෞර ඉසනි භාෂාවද ප්‍රාකෘත භාෂාවක් බව කී යේය. ඒ ශෞරසෙනි නම් ප්‍රාකෘත භාෂාව අරබයා වරරුචි ආචාර්‍යන් විසින් මේ ඉස් කියනලදී. ශෞරසෙනි, ප්‍රාකෘතිං සංසකෘතම්; ශෞරසෙනි භාෂාවි සංසකෘත ඉසන් උපන්බව මේ දක්වනලද සූත්‍රය දෙකින් ප්‍රකාශවන බැවින් ප්‍රාකෘත භාෂාවන් සංසකෘතයෙන් හෙදව තිබෙණබැවි මේයින් දතයුතු. මාගධී, හෙවින් පාළිභාෂාවද ශෞරසෙනී භාෂාවෙන් උපන්බව දක්නාලැබේ. ඒ මෙසේයි—

මාගධි, මගධානාං භාෂා මාගධී; ප්‍රකෘතිඃ ශෞරසෙනී, අසාහමාගධභාෂා ප්‍රකෘතිඃ ශෞරසෙනීති වේදිතවිඃ;

මාගධිය භාෂාවද ශෞරසෙනී භාෂාවෙන් උපන් ප්‍රාකෘතයෙක යනු මේ සූත්‍රය ලින් ප්‍රකාශකෙරේ. පෙශාචී භාෂාවද ශෞරසෙනී භාෂාවෙන් උපන්නේයයි කියනලදී. ඒ මෙසේයි, පෙශාචී, පිශාචිභාෂා භාෂා පෙශාචී; ප්‍රකෘතිඃ ශෞරසෙනී, අසාහ පෙශාචභාෂා ප්‍රකෘතිඃ ශෞරසෙනිඃ කියයි. මේසේ මාගධී-පෙශාචී-යන ප්‍රාකෘත භාෂා දෙකක් ශෞරසෙනී භාෂාවෙන් උපන්බවින් ශෞරසෙනී භාෂාවී සංසකෘතයෙන් උපන්බවින් යළිත් ප්‍රාකෘත භෙදිකාකරණ සූත්‍රවලින් පෙණේයි. ප්‍රාකෘත භාෂාවෙහි සභාවය ඒ භාෂාවන්ගේ වියාකරණසූත්‍ර ඇදුල අ ධ්‍යයනයාගේ නිසාවෙනිවීමට නොවෙහෙස් ඒ අ ධ්‍යයනී දඬිද ප්‍රාකෘත භාෂාවෝ සංසකෘතයෙන් හෙදවූවෝයයි කීය. මේ නත් පණ්ඩිතයන්ගේ මත රැස් අහුවි යේ. ප්‍රාකෘතනම්ලත් අන්‍ය භාෂාවක්හෝ මාගධික භාෂාවිහෝ මූල්වූ භාෂාවින් නොවිසඳුම් මේ අධ්‍යයනී වාක්‍යවලින් පෙණී යියයයි නිශ්චයකරමු.

තවත් ඒසඳහා සැලකියයුතුව තිබෙණ කරුණුනම්. බොඩ් ධර්මය දෙශනාකරණලද කාලයෙහි එම දෙශනාභූකූලවූ පාළිභාෂාව මහජනයාගේ කථාව්‍යවහාරයව් නැගී මගධදෙශයෙහි පැවතුනේය යනු අනුමානහැර කියමු. ඒ කාලයපවත් අපේ කාලය දක්වා ඉක්මගිය බව පෙණෙන්නේ අවුරුදු 2,400 යයි. මගධ දෙ

Digitized by Google

ශවාසි මහජනයාගේ දැන් මේ කාලයෙහි ව්‍යවහාර කථාවත් යථොක්ත බෞද්ධමී යත් දෙක බැලූකල භාෂා දෙකක්යයි කි යශ්‍යතු බවද, ලක්දිව දෙවෙනි පැතිස්ස රජු දවස පිහිටුවනලද සිලාලෙඛනයන් ගේ වාක්‍ය ඉන් මැතකාලයෙහි ලියනලද සිංහල ප්‍රකරණයන්ගේ වාක්‍යවලටත් ඒ ප්‍රකරණ මෙකල්හි පවත්නා භාෂාවටත් සමකර බලමුනම් එකින්එකට වෙනස් ව අන්‍ය අන්‍ය භාෂාවන් මෙන් පෙණිය න බවද සලකනකල එක ක්‍රමයක භාෂා වක් අවිරුදු දහසක් පමණ ලොකයාගේ කථාව්‍යවහාර වශයෙන් පැවතීම කරණ කොටගෙණ කාලය මෙන්ම ඒ භාෂාවත් ක්‍රමක්‍රමයෙන් පෙරළිගණ්වූත් අන්‍ය භ භායකට පැමිණෙනබවත් නියමයයි දනි මු. මහාභාරතය සහිත කිසි පුරාණ පොත් ලියනලද සංස්කෘත භාෂාව ඒ ප්‍රකරණ යන් ලියූ කාලය කෙරෙන් පළමු ලොක යෙහි පවතින්ට ඇත යන්නත් අනුමාන රහිතයි. මහාභාරතයහා භාගවත්පුරාණ– විෂ්ණුපුරාණදියත් ලියා තිබෙන්නේ–ශුඛි ෂීර–මහරජුගේ කාලය කෙරෙන් භූදු රු කාලයෙහියි. වර්තමාන කාලය පවත් බෞද්ධමීය ලොව ප්‍රකාශවූ කාලය දක් වා තිබෙණ අවිරුදු ගණනත් එතෑන් පවත් මහාභාරතය කරණලද කාලය දක්වා ඉක්මුහු අවිරුදු ගණනත් බලන කල දෙක එකප්‍රමාණයට පෙණියනවා යයි කියහැකි. සංස්කෘත භාෂාවෙන්ම රා මායනාදි තවත් පොත් කරණලද කාලය ර්ටත් පළමුයි. සංස්කෘත භාෂාවෙන් පොත් ලියනලද කාලය පවත් බුදුන්ගේ කා ලය දක්වා ඉක්මුනාවූ අවිරුදු ගණන තුන්දහසකට අඩුනැත යන කීම සත්‍යයි. සංස්කෘත භාෂාව කථාව්‍යවහාරවශයෙන් පවත්නා කාලයකදීම රාමායනය ලියූ න මුත් ඒ භාෂාව පාළිය කෙරෙන් උපන් එකක්නම් ර්ටවඩා කල්මත්තෙන් අවිරු දු දහසකින්වත් පළමු කථාව්‍යවහාර වශ යෙන් පාළිභාෂාව තිබිලාම ඕස එසේ නැත්නම් නුසුදුවන. මේ පිළිවෙලට බු දුන්ගේ කාලයට වඩා අවිරුදු හාරදහ සකටවත් අතීතයෙහි පාළිභාෂාව පවති න්ට ඕනෑව පෙණේ. එපමණ මහත් දීර්ඝ කාලයක් මුලුල්ලේ මිනිසුන්ගේ ව්‍යවහා ර කථාවට අයිතිවන භාෂාවක් නොවෙ නස්ව පැවත ඒම නුසුදුවන් බවට අප විසින් ඉහත දක්වනලද කරුණුම ප්‍රමා ණයි. මේ කාරණ බලනකල බුදුන්ගේ කාලයෙහි පැවතුනාවූ ප්‍රාකෘත නම්ලත් පාළිභාෂාව කෙරෙන් නොහොත් ඒ හා සමානවූ වෙනයම් ප්‍රාකෘත භාෂාවක් කෙරෙන් ර්ට වඩා පුරාණ කාලයෙහි ලොව පැවතුනාවූ සංස්කෘත භාෂාව උ පන්නායයි කියනවාට වඩා මැතකාල යෙහි පැවතුනාවූ ප්‍රාකෘත භාෂා සියල්ල ම ක්‍රමක්‍රමයෙන් පසු පසු කාලවල උපන් නායයි කීමෙහි ගැලපීම පෙණේ.

මේ අතර, මාගධී භාෂාවෙහි මුල්වූ ව්‍යා කරණ පොත් සහිත එම භාෂාවේ ඡන්දස්– නිඝණ්ටු–කාව්‍යාදි ප්‍රකරණයන් සංස්කෘත භාෂාවෙහි ඒ ඒ ශාස්ත්‍රප්‍රකරණවල නයා නුසාරයෙන් එම ප්‍රකරණ උපකාරකොට ගෙණ මැන කාලයෙහි කරණලද බවත් මිට සැලකියයුතු කරුණෙකි. මාගධී භා ෂාවෙහි මුල් ව්‍යාකරණයවූ කාතන්ත්‍රය යෙන් සූත්‍රයක් මෙම කීම පිහිටුවීම සඳහා ලියමු.

පරසමඤ්ඤා පයොගෙ, යා ච පන සකාය තඤ්ඤාසු සමඤ්ඤා හොතාති වා අහොසාති වා තා පයොගෙ සති එව්ඨාපි යුජ්ජතෙව;

සංස්කෘත ව්‍යාකරණපොත්හි හොසා හොඅයයි යම් නාමයෝ වෙද්ද ඔහු යෙදීමක් ඇතිකල්හි මාගධී ව්‍යාකරණයෙහිද යෙදෙත් යනුයි. කාතන්ත්‍රය කරණ කාල යෙහි සංස්කෘත ව්‍යාකරණයාගේ අනුසා රයෙන් ඒ කරණලදුයි මේ දක්වනලද

Digitized by Google

සූත්‍රයෙන් හැඟේ. තවද, "ප්‍රාකෘත වාක්‍යකරණයෙහිද කියනලද්දවුන් කෙරෙන් අන්‍යවූ ප්‍රත්‍යය සමාස තද්ධිත ලිඞ්ගාදිය සංස්කෘත වාක්‍යකරණය කෙරෙන් දතයුතුයි, ශෙෂඃ සංස්කෘතාත්, උක්තාදන්‍යඃ ශෙෂඃ, ප්‍රත්‍යය සමාස තද්ධිත ලිඞ්ගවණ්ණාදි විධිඃ ශෙෂඃ සංස්කෘතාදවගන්තව්‍යඃ, යි කියනලදි. මාගධී වාක්‍යකරණයෙහි හා වෙනත් ප්‍රාකෘත වාක්‍යකරණයන් කෙරෙහි සංස්කෘත වාක්‍යකරණය කෙරෙන් ලක්‍ෂණ ගතයුතු බව මෙසේ දක්වනලදබැව්හුත් ප්‍රාකෘත භාෂාවලට සංස්කෘත මූල්‍යසිකිම කාරණ සහිතයයි කියමු.

මේ සඳහාම තවත් කාරණයෙක්නම්, ඝටඃ-යඃ-සඃ-එෂඃ-යන්‍නාදි ප්‍රථමෛක වචන පදයෝ කියියම් තවත් පදයන් හා සන්ධිව-ඝටොඃ-යොඃ-සොඃ-එෂොඃ-යන්‍නාදි වශයෙන් පද ප්‍රකෘතිය පෙරලී අන්‍යරූපයන් අනතුව වාක්‍යයෙහි යෙදී ලිම් කිම් දෙක්හි සංස්කෘතයෙහි ව්‍යවහාරිත පරිවයෙන් මෙම පදරූපයෝ මාගධාදි ප්‍රකෘත භාෂාවන්හි-ඝටඃ-යන්‍නාදි පද ප්‍රකෘතිය නොලැබී විකාර රූපම ලැබ-ඝටොඃ-යොඃ-සොඃ-එෂොඃ- යන්‍නාදින් ප්‍රථමෛක වචනයෙහි ප්‍රකෘති පදයෝ වෙත්. සංස්කෘත පදයන්ගේ මූල් ප්‍රකෘති රූපය නොලැබ විකාරව ව්‍යවහාරකරණලද රූප මාගධික භාෂාදි ප්‍රාකෘතයවත් නැති ප්‍රකෘති පදව තිබෙණ මේ කාරණයෙන් ව්‍යවහාරකරණලද සංස්කෘත භාෂාවම ක්‍රම ක්‍රමයෙන්-ශෞරසෙනී- ය මාගධියයි ඒ ඒ දෙශවලදී නම් වෙනස් වීමත් අන්‍ය අන්‍ය රූපවලව ශබ්ද හා පදයන්ගේ පෙරලීම් ආදියත් සැලකියහැකි. අකාරාන්ත ශබ්දයා කෙරෙන් පරවූ-ෂිවිභක්තිහුගේ ඒඃ ආදෙශයෙහි ඔකාරයා ආදෙශවීම ප්‍රාකෘතයෙහි නියමයක් බවද මේ මතු දක්වනුලබණ සූත්‍රාදියෙන් ප්‍රකාශිතයි. අතඔත්‍යෝඃ, අකාරාන්තාච්ඡ බ්‍යාත්‍යපරස්‍ය සොඃ ඒඃ ඒන ඔඃ භවති; වෛද්‍යොඃ-(වෛද්‍යඃ) වඝභොඃ-(වඝභඃ) පුරිසොඃ-(පුරුෂඃ) යන්‍නාදියෙන් දතයුතු. මේ සේම- රාජාඃ-මඤවන්තඃ-පිතරඃ- යන්‍නාදි වෙනත් හලන්‍ය ශබ්දයන්ගේද, ගිරයඃ-භාතවඃ-ගාවඃ-යන්‍නාදි ඉවණ් උවණ්ඃ නත ඔකාරාන්තා ශබ්දයන්ගේද ප්‍රථමා බහු වචනයෙහි-රාජානොඃ- මඤවන්තොඃ- පිතරොඃ- ගිරයොඃ- භාතවොඃ-ගාවොඃ- යන්‍නාදි වශයෙන් සන්ධිවිධියෙහි වූ සංස්කෘත භාෂාවෙහි රූපයෝම මාගධික භාෂාවෙහිද ප්‍රකෘතියෙන් ප්‍රථමාබහුවචනයෙහි යෙදෙත්. අඃ-යඃ-යන්‍නාදි කිසි පම ඒෂෛක වචනපදයෝ සන්ධිවූවාහු-අතොඃ-යතොඃ-යන්‍නාදි වශයෙන් සංස්කෘතයෙහි ව්‍යවහාරවූවා සේම මාගධික ව්‍යවහාරයෙහිත් ප්‍රකෘතියෙන්ම-අතොඃ-යතොඃ-යන්‍නාදිවශයෙන් පඒෂෛක වචනයෙහි දක්නාලැබෙත්. ගුණවතඃ-මනසඃ-යන්‍නාදි කිසි ඒෂෛක වචනයන්ගේ සන්ධිවීමෙහි ප්‍රකෘතිය පෙරලී-ගුණවතොඃ-මනසොඃ යන්‍නාදිවශයෙන් සංස්කෘතයෙහි ව්‍යවහාරිත පදයෝ මාගධිකයෙහි ප්‍රකෘති ඒෂෛක වචනයෙහිම- ගුණවතොඃ- මනසොඃ- යන්‍නාදිවශයෙන් දක්නාලැබෙත්. ඝටඃ-යන්‍නාදි ප්‍රථමාබහුවචනයන්ගේද සන්ධිවීමෙහි විසර්ගීය ලොප්ව-ඝටා-යන්‍නාදිවශයෙන් වාක්‍යයෙහි යෙදී තිබෙන්නාවූ රූපය සේම මාගධිකභාෂාදි ප්‍රාකෘතයෙහි විභක්ති ප්‍රකෘති ඒනවූ රූපය ප්‍රථමාබහුවචනයෙහි දක්නාලැබේ. මේ කාරණවලින්ද ප්‍රාකෘත භාෂාවන්ගේ ඉපදීමෙහි සංස්කෘත භාෂාවගේ මූලත්වය හැඟේ.

මේ සඳහාම තවත් කාරණයෙක්නම්. සංස්කෘත ශබ්දයන්ගේ කිමෙහි දුසකර තාවය නිසා දැනට සිංහල මිනිසුන් අතුරෙහි-ප්‍රාණ-ඝෘත-වඹි-යන්‍නාදි සංස්කෘත ශබ්ද කියන කල-පරාණ-ගිරිත-වරුඝ-කියාද, එසේම වෙනත් නොයෙක් ශබ්දයන් ඝභාවය වෙනස්කර ලියන කියන බවද පෙණේ. ඉන්නිසා කථාව්‍යවහාර

ඇබ අයිතිවිසය සොඅොඑකි ශබ්ද තාසුපාසු අත්දබුඛ බැවහාරකිරීමෙන් සල්ලාමේ කෑ අසාය අසාය තාඅොවත්ගේ කුවකැණීම මෙසි ඇතු ගිස්වූ කිමක්ද කතෘවේ. මේ තු මගුවා-දැංඛුරු-යෙන සංඝකෘත ශබ්දය මා සෙ ගිණ තාඅෙවි නාගිණ මෙසාන් ප්‍රකෘතයහගෘත වලම ගෙරළි-දුඛා-කියාදු සිංහල තාඅා ඇවත්-දළ-කියාද දක්කොලැබේ. මෙහි දැංඛුරු-කෘත්‍රිම වීඛා-දුඛා-සඤ්ඤ නීමඛ යෘපය. ඒවත් ඛීඛා-දළ-යන්න කිමඛ සඤ්ඤය. ඔබපමණක්නොව මේ ශබ්දරූප තු න එහිත් එසෙව අක්ෂර මාලාවලින් ලියුවූයි ය. සුඛෝවිචාරණය පමණක්නොම ඉබා කෝයෙයින් ශබ්දයන්ගේ ලියුවුතාවයද අතිනෙ අතිතාඅ තාඅාවත්ගේ නාදිනීමෙනි ලතුණෙකෘයි කිම සුදුසුද සඳහන් සෙවිය යුතු.

සංඝකෘත තාඅොමෙහි ශබ්දාදියෙන් ඵ පත් පාළිතාඅොමෙහි තා ප්‍රාකෘතය තාම් ත වත් තාඅාවත්ගේද සිංහල තාඅා වහිද ශබ්දාදිය මෙහි දක්විඇුලැබේ.

සංඝකෘත ශබ්දාදිය.	පාළි.	ප්‍රාකෘත.	සිංහල.
සංඝකෘත ..	සඛකත ..	——— ..	සඛ
මාහරාජ්ඤී ..	මහාරඤී ..	මරාවී ..	———
ශ්‍රී ..	සිරි ..	සිරී ..	සිරි
ශ්‍රී ..	සිරි ..	සිරී ..	සිරි
හ්‍රස්ව ..	රස්ස ..	හංස ..	———
ශ්‍රම්‍ය ..	මස්සු ..	මස්සු ..	මස්
සාෂී ..	එස්ස ..	එංස ..	පස්
රාජධීකා ..	රාජධීකා ..	රාජධීඅ ..	රදු
ශාකාසිංහ ..	සකාසිඛ ..	——— ..	සෑහි
පාත්‍රාධාතු ..	පත්තධාතු ..	——— ..	පාදු
ඛෘතරාෂ්ට්‍ර ..	ඛත්තරඨ ..	——— ..	දතරට
බෘහස්පති ..	——— ..	භඅපපඊ ..	———
කෘෂ්ණ ..	කණ්හ ..	කණ්හ ..	කළු
යාවත් ..	යාව ..	ජා ..	———
උදුම්බර ..	උදුම්බර ..	උංවර ..	දිඹුල්
භාජන ..	භාජන ..	භාණ ..	බදුන්
ඉෂ්ටදේවතා ..	ඉට්ඨදේවතා ..	ඉොලා ..	———
ආයුෂ් ..	ආයු ..	ආයු ..	ආ
වර්ෂ ..	වස්ස ..	වස්ස ..	වා
ගෘහිතා ..	ගහෙතා ..	ඝෙඵාණ ..	ගෙණ
ශ්‍රුතාන ..	සුතාන ..	සොඵාණ ..	අසා
පෘෂ්ඨ ..	පිට්ඨ ..	පුඨී ..	———
ප්‍රශ්න ..	පඤ්හ ..	පණ්හ ..	පැණ
ක්ෂමා ..	ඛමා ..	ඛමා ..	සමා
ක්ලාන්ත ..	කිලන්ත ..	කිලන්ත ..	———
ක්ලේශ ..	කිලෙස ..	කිලෙස ..	කෙලෙස
ක්ලිෂ්ට ..	කිලිට්ඨ ..	කිලිට්ඨ ..	කිලිටි

Digitized by Google

සංස්කෘතශබ්දාදිය.	පාළි.	ප්‍රාකෘත.	සිංහල.
ජීවතා ..	ජීවිතා ..	ජීවිආ ..	ළිවි
ඝටිත ..	ඝටිත ..	ඝටිඅං ..	———
ශලාඝතේ ..	සඝති ..	ඝඅඅ ..	———
ලඝුඃ ..	ලහු ..	ලහූ ..	———
ක්ෂුද්‍රක ..	ඛුද්දක ..	ඛුඡ්ඣඅ ..	ගුණි
